# 2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

## මාලිගාවත්ත, කොළඹ -10

## වැය ශීර්ෂ අංකය : 290


| අන්තර්ගතය | පිටු අංක |
| --- | --- |
| **01.** ආයතනික පැතිකඩ | **2-7** |
| **02.** ප්‍රගතිය හා ඉදිරි දැක්ම | **8-25** |
| **03. 2023** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය | **26-33** |
| **04.** කාර්යසාධන දර්ශක | **34-37** |
| **05.** තිරසර සංවර්ධන අරමුණු **(SDG)** සපුරා ගැනීමේ කාර්යසාධනය | **38-40** |
| **06.** මානව සම්පත් පැතිකඩ | **41-45** |
| **07.** අනුකූලතා වාර්තාව | **46-52** |

# 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

## 1.1. හැඳින්වීම

ධීවර අමාත්‍යාංශය යටතේ පවතින ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයභාරයන් වනුයේ 1979 අංක 59 දරණ ධීවර (විදේශ ධීවර යාත්‍රා) පනත, 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත හා ඒ යටතේ සාදන ලද නියෝග ක්‍රියාත්මක කිරීමත්, වර්තමාන ප්‍රවණතා සහ ජාත්‍යන්තර සාගර නීති, සම්මුතීන්ට අනුකූලව කළ යුතු සංශෝධන හා නව නියෝග හඳුන්වා දීම මගින් ධීවර කර්මාන්තය කළමනාකරණය හා නියාමනය කිරීම ය.

එසේම, ධීවර කර්මාන්තයේ සංවර්ධනය උදෙසා නව තාක්ෂණය හඳුන්වා දීම ද, පසු අස්වනු හානිය අවම කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ද, අපනයන හා දේශීය පරිභෝජනය සඳහා වන මත්ස්‍ය නිෂ්පාදනවල තත්ත්වය සහ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට අදාළ වැඩිදියුණු කිරීම ද, ධීවර කුටුම්භයන්හි සමාජ හා ආර්ථික තත්ත්වය නංවා ගැනීම සඳහා ධීවරයින් සහ ධීවර කාන්තාවන් සවිබල ගැන්වීම ද ප්‍රමුඛ කාර්යයන් අතරට ඇතුළත් වේ.

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම**

ධීවර සහ ජලජ සම්පත් තිරසරභාවයෙන් යුක්තව පවත්වා ගනිමින් ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම හරහා ජාතික ආර්ථිකයට ප්‍රශස්ථ දායකත්වයක් ලබා දීම

**මෙහෙවර**

ධීවර කර්මාන්තයෙහි තිරසාර සංවර්ධනය හරහා ශ්‍රී ලංකා ආර්ථිකයට ඵලදායී දායකත්වයක් ලබා දීම සඳහා ජාතික හා ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව නව තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් ධීවර සහ ජලජ සම්පත් කළමනාකරණය කිරීම

### 1.2.1. අරමුණු

- දේශීය, ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව ධීවර කටයුතු කළමනාකරණය, විධිමත් කිරීම, සංරක්ෂණය සහ තිරසාර සංවර්ධනය
- ධීවර ක්ෂේත්‍රයේ දේශීය හා විදේශීය ආයෝජන දිරි ගැන්වීම

- දේශීය සහ ජාත්‍යන්තර මුහුදේ මත්ස්‍ය සම්පත් නෙලීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම
- ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නංවාලීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන්හි තත්ත්වය සහ සුරක්ෂිතභාවය සහතික කිරීම
- පසු අස්වනු නාස්තිය අවම කිරීම සහ දේශීය මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරිම
- අන්තර්ජාතික ප්‍රඥප්ති සහ කලාපීය සම්මුතීන්ට අනුකූලව ධීවර මෙහෙයුම් සිදු කරන බවට සහතික වීම
- වරාය රාජ්‍ය පියවරයන් ක්‍රියාත්මක කිරීමේ නියෝග මාලාවට අනුව වරාය සේවා ක්‍රියාත්මක කිරීම
- මහ මුහුදේ ධීවර කටයුතුවල යෙදෙන යාත්‍රාවල මෙහෙයුම් අධීක්ෂණය හා ආරක්ෂාව තහවුරු කිරිම
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට ධීවර ජනතාවට හා අනෙකුත් සේවාදායකයින් හට ප්‍රශස්ත සේවාවක් ලබා දීම
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට ධීවර ක්ෂේත්‍රයට අදාළ දත්ත තොරතුරු කඩිනමින් හා නිරවුල්ව ලබා ගත හැකි වීම

## 1.3. ප්‍රධාන කාර්යයන්

- ධීවර මෙහෙයුම් නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ධීවර කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ජලජීවී වගා කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම, උකස් කිරීම හා ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම
- සජීවී මසුන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම
- විදේශීය ධීවර යාත්‍රා සඳහා මසුන් ගොඩ බෑම පිණිස බලපත්‍ර නිකුත් කිරීම
- ධීවර කළමනාකරණය පිළිබඳ ධීවර ජනතාවගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම
- ප්‍රාග්ධන භාණ්ඩ ලබා ගැනීම සඳහා ආයතනික ණය පහසුකම් සම්බන්ධීකරණය
- ධීවර යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීම, නියාමනය සහ අධීක්ෂණය කිරීම
- ධීවර යෙදවුම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම, නියාමනය සහ අධීක්ෂණය කිරීම
- ධීවර සමුපකාර සමිති කාර්යක්ෂම මට්ටමට ගෙන ඒම සඳහා මාර්ගෝපදේශකත්වය සැපයීම
- ජාතික ධීවර සම්මේලනය යටතේ පිහිටුවා ඇති ග්‍රාමීය ධීවර සංවිධාන සම්බන්ධීකරණය සහ අධීක්ෂණය
- ධීවර කර්මාන්තයට අදාළ දත්ත රැස් කිරීම

- විදේශ රටවල් විසින් අත්අඩංගුවට ගැනෙන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම
- මුහුදේ අතරමං වන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම
- අපනයන කරනු ලබන මසුන් තත්ත්ව පරීක්ෂණයකට භාජනය කිරීම
- මසුන් සකස් කිරීමේ ස්ථාන ලියාපදිංචි කිරීම සහ මත්ස්‍ය අපනයන සඳහා ස්වස්ථා සහතික නිකුත් කිරීම
- දේශීය පරිභෝජනය සඳහා මසුන් වෙළඳාම් කරන ස්ථානවල තත්ත්වය උසස් කිරීම
- මහ මුහුදේ ධීවර කර්මාන්තයට එක් වූ බහුදින යාත්‍රා සඳහා යාත්‍රා නිරීක්ෂණ උපකරණ සවි කිරීම
- ධීවර යාත්‍රා සහ ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ සන්නිවේදන පහසුකම් ලබා දීම
- දේශසීමාවන් උල්ලංඝනය කරමින් ගමන් කරන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබා ගැනීම
- දිනපතා කාලගුණ වාර්තා සහ අයහපත් කාලගුණික පූර්ව තොරතුරු දෛනිකව ලබා දීම
- යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මගින් ලබා දෙන තොරතුරු අනුව යාත්‍රා දැනුවත් කිරීම
- අනවසර විදේශීය ධීවර යාත්‍රා සහ කාර්මිකයින් පිළිබඳ අදාළ ආයතන දැනුවත් කිරීම
- ධීවර යාත්‍රාවල සන්නිවේදන කටයුතු සඳහා බලපත්‍ර සහ ඇමතුම් සංඥා ලබා දීමට කටයුතු කිරීම
- ධීවර කාර්මිකයින් සහ යාත්‍රාවන් සම්බන්ධ අනතුරුවල දී රක්ෂණය සඳහා තොරතුරු සනාථ කර දීම
- අන්තර්ජාතික මුහුදු සීමාවන්හි පාවී යමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම
- ධීවර පවුල්වල සාමාජිකයන්ගේ වෘත්තීය අධ්‍යාපනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ධීවර කාර්මික රක්ෂණය සහ විශ්‍රාම වැටුප් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම මගින් ධීවර සමාජ ආරක්ෂණය
- කලපු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ධීවර ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය
- ධීවර කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

## 1.4. සංවිධාන ව්‍යුහය

ධීවර අමාත්‍යාංශය යටතේ පවතින ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල්වරයකු මගින් පාලනය වේ. එම කටයුතු වඩාත් සඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකු ද පත් කර ඇත. දෙපාර්තමේන්තුවේ කාර්යයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීමේ පහසුව සළකා ප්‍රධාන කාර්යාලයේ කටයුතු අංශ 09කට බෙදා වෙන් කර තිබේ.

එනම්,

1. කළමනාකරණ අංශය
2. සංවර්ධන අංශය
3. තත්ත්ව පාලන අංශය
4. ධීවර මෙහෙයුම් අංශය

5. විමර්ශන හා පුහුණු අංශය
6. තොරතුරු හා තාක්ෂණ අංශය
7. පාලන අංශය
8. ගිණුම් අංශය
9. අභ්‍යන්තර විගණන අංශය

මෙම අංශවල කටයුතු මෙහෙයවීම අධ්‍යක්ෂවරුන් 07 දෙනෙකු, ප්‍රධාන ගණකාධිකාරි හා ප්‍රධාන අභ්‍යන්තර විගණක මගින් ඉටු වේ.

දිවයිනේ මුහුදුබඩ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ කාර්යාල 15ක් පිහිටුවා තිබෙන අතර, එක් එක් දිස්ත්‍රික්කයේ කටයුතු එම දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරයාගේ මෙහෙය වීම යටතේ ඉටු වේ.

දිස්ත්‍රික්ක තුළ මුහුදුබඩ ප්‍රදේශ ආවරණය වන පරිදි ධීවර පරීක්ෂක කොට්ඨාශ 149ක් පිහිටුවා ඇත. මෙම සෑම ධීවර පරීක්ෂක කොට්ඨාශයක ම ධීවර පරීක්ෂක කාර්යාලය බැගින් ස්ථාපිත කර ඇත. ධීවර පරීක්ෂක, ධීවර සමාජ සංවර්ධන සහකාර, ධීවර සම්පත් කළමනාකරණ සහකාර, සංවර්ධන නිලධාරි සහ ධීවර නිලධාරි යන නිලධාරීන් විසින් මෙම ධීවර පරීක්ෂක කොට්ඨාශ තුළ සියලු ධීවර කටයුතු ක්‍රියාත්මක කෙරේ.

එසේම, ධීවර වරායන් ආශ්‍රිතව ප්‍රාදේශීය සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන 20ක් පිහිටුවා ඇති අතර ගුවන් විදුලි නිලධාරීන් දිවා-රාත්‍රී මෙම මධ්‍යස්ථානවල සේවයේ යොදවා ඇත. මෙම ප්‍රාදේශීය සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන මගින් මහ මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදී සිටින ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවුඩ හුවමාරු සම්බන්ධතාවය පැය 24 පුරා ම තබා ගැනීමට කටයුතු කර ඇත. එමගින්, යාත්‍රා සඳහා කාලගුණ වාර්තා හා හදිසි පූර්ව අනතුරු ඇඟවීම් ද දෛනිකව ලබා දෙන අතර, යාත්‍රා හිමියන්ගේ පණිවුඩ ලබා දීම හා ධීවර කාර්මිකයින්ගේ පණිවුඩ ලබා ගැනීම් ද සිදු කරනු ලබයි. තවද, ධීවර යාත්‍රාවලින් ලැබෙන හදිසි ආපදා පණිවුඩ සඳහා එම අවස්ථාවේ සිට එම කාර්යය අවසන් වන තෙක් අවශ්‍ය සියලු කටයුතු සිදු කරනු ලබයි. මෙම සියලු කාර්යයන් කොළඹ ප්‍රධාන කාර්යාලයේ පිහිටි සෝදිසි මෙහෙයුම් මැදිරිය විසින් සම්බන්ධීකරණය කරනු ලබයි.

ඊට අමතරව, දිස්ත්‍රික්ක 07ක පිහිටි ධීවර වරායන් 15ක වරාය කාර්යාල පිහිටුවා ඇති අතර ධීවර පරීක්ෂක සහ සංවර්ධන නිලධාරි යන නිලධාරීන් විසින් දිවා-රාත්‍රී වරායෙන් පිටත්වන යාත්‍රා පරීක්ෂා කිරීම, පිටත්වීම ලියාපදිංචිය හා අවසර ලබා දීම, වරායට පැමිණෙන ධීවර යාත්‍රා ගමන් වාරයට අදාළ ලොග් සටහන ලබා ගැනීම, මත්ස්‍ය අස්වැන්න පරීක්ෂාව, අපනයනයට නියමිත මත්ස්‍ය තොග සඳහා වාර්තා සකස් කර ගැනුම්කරුවන්ට ලබා දීම, නීති විරෝධී, වාර්තා නොවූ හා අවිධිමත් ධීවර කටයුතු සිදු වී තිබේ නම් ප්‍රකාශ ලබා ගැනීම, ලොග් සටහන් සහ ලබා ගත් ප්‍රකාශ ෆැක්ස් හා ඊමේල් මගින් ප්‍රධාන කාර්යාලය වෙත ලබා දීම සහ විකල්ප නිරීක්ෂණ වාර්තා සකස් කිරීම ආදී කටයුතු සිදු කෙරේ.

ජාත්‍යන්තර මුහුද වෙත මසුන් මැරීම සඳහා යන සියලු බහුදින යාත්‍රා, චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ අධීක්ෂණය කිරීම අන්තර්ජාතික නීති රීතිවල අනිවාර්යය අංගයකි. ඒ අනුව, 2015 වර්ෂයේ සිට ජාත්‍යන්තර මුහුදේ මෙහෙයුම් බලපත්‍ර ලබා ගත් යාත්‍රා පමණක් යාත්‍රා නිරීක්ෂණ පද්ධතියක් (VMS) මගින් නිරීක්ෂණය කළ ද, ඉහත ජාත්‍යන්තර නීති රීති සහ මත්ස්‍ය අපනයන අවශ්‍යතාව අනුව සියලුම බහුදින යාත්‍රා යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය (VMS) මගින් ආවරණය කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගිණි. බහුදින යාත්‍රා මගින් සිදු කරන ධීවර නොවන අනෙත් නීති විරෝධී කටයුතු (උදා: නීති විරෝධී සංක්‍රමණ සහ මත්ද්‍රව්‍ය ප්‍රවාහන කටයුතු) හඳුනා ගැනීමේ වියදම් අඩු ක්‍රමවේදයක් ලෙස ද මෙම අවශ්‍යතාවය මතු වී තිබිණි.

ඒ අනුව, ඉහත අවශ්‍යතාවයට සරිලන යාත්‍රා නිරීක්ෂණ පද්ධති (VMS) ඒකක 4200කින් සමන්විත සම්පූර්ණ යාත්‍රා නිරීක්ෂණ පද්ධතියක් ඕස්ට්‍රේලියානු රජයේ ප්‍රදානයක් ලෙස දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී.

නව යාත්‍රා නිරීක්ෂණ පද්ධතියට (VMS), සියලුම වරාය කාර්යාල හරහා ප්‍රවේශ වීමේ හැකියාව පවතින අතර ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පිහිටා ඇති ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය (FMC) මගින් 24x7 පුරා මධ්‍යගතව එම කටයුතු කළමනාකරණය කරයි. නීතිවිරෝධී ධීවර කටයුතු, මිනිස් ජාවාරම්, මත්ද්‍රව්‍ය ජාවාරම් සහ නීතිවිරෝධී දේශ සීමා තරණය වැනි නීතිවිරෝධී ක්‍රියාකාරකම් සිදු විය හැකි අවදානම් යාත්‍රා හඳුනා ගැනීම මෙම මධ්‍යස්ථානය සතු පහසුකම් මගින් සිදු කළ හැකි ය. එමෙන්ම, හදිසි ආපදා තත්ත්වයන්හි දී ධීවර යාත්‍රා සඳහා පහසුකම් සැලසීමට ද මෙම පද්ධතිය යොදා ගත හැකි ය. මෙම ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය, සියලු නවීන තාක්ෂණය භාවිතයෙන් නවීකරණය කර ඇති අතර, වර්තමානයේ දී මෙය ආසියාවේ ඇති අති නවීන අධීක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස ද සැළකිය හැකි ය.

එසේම, යාත්‍රා නිරීක්ෂණ ඒකකය, ධීවර මෙහෙයුම් අංශය සහ ධීවර වරායන්වල පිහිටුවා ඇති අන්තර්ජාතික ධීවර කටයුතු ඒකක සමඟ සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක වන උප කාර්යාලයක්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි පිහිටුවා ඇත. මෙම කාර්යාලය මගින් ධීවර නිෂ්පාදන අපනයනයේ දී, විශේෂයෙන් ම, යුරෝපා සංගමයට අයත් රටවල් සඳහා අපනයනයේ දී සෑම මත්ස්‍ය තොගයක් සඳහා ම මසුන් ඇල්ලීමේ සහතික (Catch Certificates) නිකුත් කිරීම සහ ධීවර නිෂ්පාදන ප්‍රතිඅපනයනය සඳහා මසුන් ආනයනයේ දී අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදු කරනු ලබයි. දිනපතා ගුවන් මගින් සිදු කරනු ලබන අපනයනයන් සඳහා අවශ්‍ය සහතික කඩිනමින් සහ ප්‍රමාදයකින් තොරව නිකුත් කිරීමේ පහසුව සඳහා තත්ත්ව පාලන ඒකකයක් ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ස්ථාපනය කර ඇති අතර, එය පැය 24 පුරාවට ම (24x7) විවෘතව පවතී.

ගොඩබිමට පැමිණෙන සෑම බහුදින යාත්‍රාවක ම සම්පූර්ණ ගමන් වාරය පිළිබඳව පිහිටීමේ තොරතුරු සහිත යාත්‍රා නිරීක්ෂණ පද්ධතියේ (VMS) ගමන්මග එම යාත්‍රාවට අදාළ ලොග් පිටුව සමඟ පරීක්ෂා කිරීමෙන් පසු යාත්‍රා නිරීක්ෂණ පද්ධතියේ (VMS) දත්ත සමඟ සැසඳේ නම් පමණක් එම මත්ස්‍ය තොගය අපනයනය කිරීමට හැකි වන ලෙසත් මෙම යාත්‍රාව කිසිදු නීතිවිරෝධී ධීවර කටයුත්තක් සිදු නොකොට නීත්‍යානුකූලව

මසුන් අල්ලා ගෙන පැමිණි යාත්‍රාවක් බවටත් සහතික කර ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සත්‍යාපන වාර්තාවක් නිකුත් කරනු ලබයි. මෙම සත්‍යාපන වාර්තාව, කටුනායක පිහිටි ගුවන්තොටුපල තත්ත්ව පාලන ඒකකය වෙත යොමු කිරීමෙන් පසුව එම යාත්‍රාවේ එම ගමන් වාරයට අදාළ මසුන් සඳහා අපනයනය කිරීමට අවශ්‍ය ඇල්ලුම් සහතිකය (Catch Certificate) නිකුත් කරනු ලබයි. මෙම මත්ස්‍ය තොරතුරු සත්‍යාපන ක්‍රියාවලිය, පැය 24 පුරා ම ආවරණය වන පරිදි සතියේ දින 07 පුරා දිවා-රාත්‍රී (24x7) ක්‍රියාත්මක කිරීමේ කටයුතු, වරාය මෙහෙයුම් කාර්යාල (21ක්), කොළඹ ප්‍රධාන කාර්යාලයේ පිහිටි යාත්‍රා නිරීක්ෂණ ඒකකය, ජාත්‍යන්තර ධීවර කටයුතු ඒකකය හා කටුනායක බණ්ඩාරනායක ගුවන් තොටුපලේ ඇති තත්ත්ව පාලන ඒකකය යන කාර්යාලවල සිදු කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය හේතුවෙන්, බහුදින යාත්‍රා මගින් දිවයිනට රැගෙන එනු ලබන නීත්‍යනුකූල මත්ස්‍ය තොග නියමිත පරිදි වාර්තා සහිතව සහ බලපත්‍ර සහිතව අල්ලා ගන්නා ලද ඒවා බවට සහතික කොට අපනයනය සඳහා යොමු කිරීමට අවස්ථාව හිමි වේ.

## 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1. විශේෂ ජයග්‍රහණ

1. යාත්‍රා නිරීක්ෂණ උපකරණ සම්බන්ධ පවත්නා නීතිවලට අනුකූල නොවීම සම්බන්ධව 2023 වසර තුළ

| | |
|---|---|
| යාත්‍රා පිටත්වීම අවලංගු කිරීම (Departure Cancel) | 169 |
| නීතිමය පියවර ගැනීම සඳහා යොමු කිරීම | 46 |

2. ධීවර හා ජලජ සම්පත් පනත යටතේ සාදන ලද නියෝග

2.1 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත සංශෝධනය කිරීමේ පනත් 01ක් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇත.

- 2023 අංක 27 දරණ ධීවර හා ජලජ සම්පත් පනත

2.2 ධීවර හා ජලජ සම්පත් පනත යටතේ සාදන ලද අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග 05ක් සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇත.

- මහ මුහුදේ ධීවර මෙහෙයුම්වල යෙදෙන ධීවර බෝට්ටු චන්ද්‍රිකා දත්ත මගින් අධීක්ෂණය කිරීමේ පද්ධතිය (VMS) ක්‍රියාත්මක කිරීමේ නියෝග 2015 (සංශෝධන)
- ධීවර මෙහෙයුම් නියෝග ( සංශෝධන )
- විනෝදය සඳහා මසුන් මැරීමේ ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීමේ නියෝග
- යාන්ත්‍රික ධීවර බෝට්ටු පිටත්වීමේ සහ පැමිණීමේ නියෝග
- කෘතිම උපස්ථර මත වගා කරන කොරල් විශේෂ ආනයනය සහ අපනයනය කිරීමේ නියෝග

2.3 ධීවර හා ජලජ සම්පත් පනත යටතේ කෙටුම්පත් කරන ලද නියෝග මාලා 01ක් නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

- ධීවරයින්ගේ විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ පිළිබඳ නියෝග

2.4 ධීවර හා ජලජ සම්පත් පනත යටතේ කෙටුම්පත් කරන ලද නියෝග මාලා 03ක් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

- මසුන් පරිහරණය සහ බෙදාහැරීමේ නියෝග
- ධීවර හැඳුනුම්පත් නිකුත් කිරීමේ නියෝග - 2023
- ග්‍රාමීය ධීවර සංවිධාන/ දිස්ත්‍රික් සංවිධාන/ ජාතික ධීවර සම්මේලනය පිහිටුවීමේ නියෝග 2023

2.5 ධීවර හා ජලජ සම්පත් පනත යටතේ කෙටුම්පත් කරන ලද නියෝග මාලා 01ක් අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා රජයේ මුද්‍රණාලය වෙත යොමු කර ඇත.

- 2019 නියමුවන් (දේශීය ධීවර බෝට්ටුවල) සඳහා ප්‍රවීණතා සහතික නිකුත් කිරීමේ නියෝග (සංශෝධන)

2.6 ධීවර හා ජලජ සම්පත් පනත යටතේ බලාත්මක වන නියෝග මාලා 01ක් කෙටුම්පත් කර ඇත.

- ටින් කරන ලද මසුන් සම්බන්ධ නියෝග

2.7 නව ධීවර හා ජලජ සම්පත් පනත් කෙටුම්පත, ගරු. ධීවර අමාත්‍යතුමා සමඟ සාකච්ඡා මට්ටමේ පවතී.

3. මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා නිකුත් කරන ලද බලපත්‍ර ගණන

- මුහුදු ආහාර අපනයනය සඳහා ස්වස්ථතා සහතික සංඛ්‍යාව 37,535
- මසුන් ඇල්ලීමේ සහතික සංඛ්‍යාව 18,408
- මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන හා මත්ස්‍ය ඇසුරුම් මධ්‍යස්ථාන ලියාපදිංචි සංඛ්‍යාව 65

4. තොරතුරු තාක්ෂණික ප්‍රගතිය

1. ධීවර හැඳුනුම්පත් 10,000ක් පමණ 100% දෙපාර්තමේන්තුවේ සම්පත් පමණක් උපයෝගී කර ගෙන මුද්‍රණය කිරීම
2. ශ්‍රී ලංකාවේ හොඳම වෙබ් අඩවි තෝරා ගැනීමට 2023 වර්ෂයේ පැවැත් වූ Bestweb.lk තරගාවලියේ දී දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට රජයේ වෙබ් අඩවි අංශයෙන් තෙවන ස්ථානය ලබා ගැනීම සම්බන්ධයෙන් සම්මානයක් ලබා ගැනීම
3. දෙපාර්තමේන්තු නිලධාරීන් හට නවත ම ටැබ් යන්ත්‍ර 103ක ප්‍රමාණයක් ලබා දීම
4. රාජකාරී කටයුතු සඳහා ජාලගත මෘදුකාංය (MSDFAR) භාවිත කිරීම ආරම්භ කර ඇති අතර, මේ වන විට සාර්ථකව එමගින්, ධීවර ලියාපදිංචි කිරීම් (Fishermen Registration) 49,000ක්, යාත්‍රාංගන ලියාපදිංචි කිරීම් (Yard Registration) 180ක්, යාත්‍රා සැලසුම් අනුමත කිරීම් (Boat Design Approval) 1,535ක්, බෝට්ටු අංක ලියාපදිංචි කිරීම් (Boat Number Registration) 7,400ක්, යාත්‍රා ලියාපදිංචි කිරීම් (Boat Registration) 4,590ක්, යාත්‍රා අලුත් කිරීම් (Boat Renewal) 4,485ක්, මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම් (Operation Licence Issuance) 10,200ක්, මෙහෙයුම් බලපත්‍ර අලුත් කිරීම් (Operation Licence Renewal) 870ක්, විද්‍යාත්මක දත්ත ඇතුළත් කිරීම් (Scientific Data Entry) 1,600ක්, නියමු ලියාපදිංචි කිරීම්

(Skipper Licence Registration) 9,420ක්, මත්ස්‍ය ඇල්ලුම් සහතිකය නිකුත් කිරීම් (Catch Certificate Issuance) 1,427ක් පමණ සිදු කිරීම

5. නව යාත්‍රා නිරීක්ෂණ පද්ධති (VMS) 4,512ක ප්‍රමාණයක් සවි කිරීම

5. විදේශීය රටවල දී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදා ගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම

| අත්අඩංගුවට පත් ධීවරයින් සංඛ්‍යාව | මුදා ගත් ධීවරයින් සංඛ්‍යාව | අත්අඩංගුවට පත් යාත්‍රා සංඛ්‍යාව | මුදා ගත් යාත්‍රා සංඛ්‍යාව |
|---|---|---|---|
| 113 | 74 | 22 | 07 |

6. දේශීය, ජාත්‍යන්තර හා විදේශ රටවලට අයත් මුහුදු සීමාවන්හි පාවී යමින් තිබූ යාත්‍රා බේරා ගැනීම

| මුදා ගැනීමේ කටයුතු සිදු කළ ධීවරයින් සංඛ්‍යාව | මුදා ගැනීමේ කටයුතු සම්බන්ධීකරණය කළ ධීවර යාත්‍රා සංඛ්‍යාව | නැව්වල හැපී විනාශ වූ යාත්‍රා | අත් හැර දමන ලද බහුදින යාත්‍රා සංඛ්‍යාව |
|---|---|---|---|
| 450 | 75 | 01 | 03 |

7. මහ මුහුදේ ධීවර මෙහෙයුම් සිදු කරන යාත්‍රාවල තොරතුරු සත්‍යාපනය කිරීම

| | | |
|---|---|---|
| 1. | මහ මුහුදේ මෙහෙයුම්වලට අදාළව ධීවර යාත්‍රාවලින් ලැබුණු ලොග් පිටපත් ගණන | 39,191 |
| 2. | මෙහෙයුම්වලට අදාළව නිකුත් කරන ලද සත්‍යාපන වාර්තා ගණන | 3,024 |
| 3. | ලොග් දත්ත ගබඩාව වෙත ඇතුළු කරන ලද ලොග් පිටපත් ගණන | 35,112 |

8. තොරතුරු තාක්ෂණය භාවිතයෙන් සේවා සැපයීම

| | | |
|---|---|---|
| 1. | මාර්ගගත ක්‍රමයට යාත්‍රා සඳහා ගමන්වාර ලබා දීම | 65,618 |
| 2. | IOTC අවශ්‍යතා සඳහා පවත්වා ගනු ලබන දත්ත පද්ධතිය වෙත ඇතුළත් කරන ලද යාත්‍රා ඡායාරූප වාර්තා ගණන | 849 |
| 3. | AIS උපකරණ නීත්‍යානුකූලව ලියාපදිංචි කිරීම | 3,443 |

9. විමර්ශන කටයුතුවල ප්‍රගතිය - 2023

| අනු අංකය | ක්‍රියාකාරකම් | කාර්ය දර්ශක | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|
| 01 | දිස්ත්‍රික් මට්ටමේ වැටලීම් සහ නීතිවිරෝධී ධීවර කටයුතුවලට එරෙහි විමර්ශන හා නෛතික කටයුතු සුපරීක්ෂණය | දිස්ත්‍රික් මට්ටමේ නෛතික කටයුතු පිළිබඳව පවත්වා ගන්නා යාවත්කාලීන දත්ත වාර්තාව | 05 |
| 02 | පරිපාලන දඩ පැනවීම සඳහා සියලු දිස්ත්‍රික් කාර්යාලවලින් යොමු වන ඉල්ලීම්, අදාළ ක්‍රියාවලියට අනුව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පරිපාලන දඩ පැනවීමේ ක්‍රමවේදය සකස් කිරීම | පරිපාලන දඩ පැනවීමට යටත් කරන ලද නඩු සංඛ්‍යාව | 29 |
| 03 | තහවුරු වන නීතිවිරෝධී කටයුතුවලට එරෙහිව අධිකරණයේ නඩු පැවරීම | පවත්වන ලද නඩු සංඛ්‍යාව | 07 |
| 04 | යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය (VMS) මගින් හඳුනා ගන්නා ලද නීති කඩ කිරීම සඳහා වන විමර්ශන කටයුතු සිදු කිරීම | යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය (VMS) මගින් නීති කඩ කිරීම් සඳහා වන විමර්ශන ගණන | 529 |
| 05 | විශේෂ වැටලීම් සිදු කිරීම | සැලසුම් කරන ලද වැටලීම් ප්‍රමාණය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිශතය | 07 |
| 06 | ධීවර යාත්‍රා, ධීවර ආම්පන්න, නිෂ්පාදන සහ ධීවර ඇම සැපයුම් ආයතන සම්බන්ධ පරීක්ෂා කිරීම් සහ විමර්ශන කටයුතු | පරීක්ෂාවන් ගණන | 20 |
| | | නඩු පැවරීම් ගණන | 0 |
| 07 | සියලු දිස්ත්‍රික් කාර්යාල, ධීවර පරීක්ෂක කාර්යාල, ගුවන් විදුලි මධ්‍යස්ථාන සහ වරාය කාර්යාල පරීක්ෂණ සහ විමර්ශන කටයුතු | සිදු කළ කාර්යාල පරීක්ෂණ ගණන (එක් කාර්තුවකට එක් පරීක්ෂාවක් බැගින්) | 05 |

10. 2023 වර්ෂයට අදාළව සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබා දීම සඳහා කාර්යක්ෂම සහ පරිසර හිතකාමී නව තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතයෙන් ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම, විධිමත් කිරීම මගින් මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම හා ධීවර ප්‍රජාවගේ සමාජීය, ආර්ථික හා සමාජ සුබ සාධන තත්ත්වය ඉහළ නැංවීමට අවශ්‍ය පියවර ගැනීම ධීවර සංවර්ධන කටයුතුවල ප්‍රමුඛතම වගකීම වේ. ඊට අදාළව, පහත කාර්යභාරයන් ද සිදු කරන ලදී.


- ධීවර ක්ෂේත්‍රය සඳහා නව තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම, ප්‍රවර්ධනය කිරීම සහ ඒ හා සම්බන්ධ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීමට පුහුණු අංශය සමඟ සම්බන්ධීකරණය
- ධීවර සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම (රක්ෂණ විශ්‍රාම වැටුප්)
- වෙරළාශ්‍රිත ධීවර කර්මාන්තය සංවර්ධනය සඳහා නව ධීවර යෙදවුම් සහ සාම්ප්‍රදායක නොවන ධීවර මෙහෙයුම් ක්‍රම හඳුන්වා දීමේ කටයුතු අධීක්ෂණය
- වෙරළාශ්‍රිත ඉදිකිරීම් හා ව්‍යාපෘතිවලට අදාළව නිර්දේශ ලබා දීම
- සහසහභාගිත්ව කළමනාකරණ ප්‍රදේශ නම් කිරීම හා ඒ හා සම්බන්ධ කටයුතු සිදු කිරීම
- ධීවර සංවර්ධන කටයුතුවලට අදාළ අයවැය යෝජනා සකස් කිරීම සහ යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය කිරීම
- දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම සංවිධානය කිරීම සහ ප්‍රගති සමාලෝචනයට අදාළ කටයුතු
- විශේෂ ධීවර ගැටළු සම්බන්ධීකරණය
- ධීවර යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීම නියාමනය හා අධීක්ෂණය කිරීම
- ධීවර යාත්‍රා සැලසුම් සඳහා අනුමැතිය ලබා දීම
- ධීවර යෙදවුම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම නියාමනය සහ අධීක්ෂණය කිරීම
- වෙරළාශ්‍රිත ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාළව පාරිසරික ඇගයීම් වාර්තා සඳහා නිර්දේශ ලබා දීම
- ධීවර ක්ෂේත්‍රයට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය සහ පසු අස්වනු තාක්ෂණික වැඩසටහන් සැලසුම් ක්‍රියාත්මක කිරීම
- විකල්ප ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ධීවර සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ධීවර ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ එහි ප්‍රගතිය සමාලෝචනය කිරීම
- සියලු කලපු තිරසාර ලෙස සංවර්ධනය, කළමනාකරණය, විධිමත් කිරීම හා සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක කිරීම
- ධීවර කර්මාන්තය සඳහා ආනයනය කරනු ලබන යෙදවුම් සම්බන්ධ කටයුතු
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ මතු වන ධීවර ගැටළු සඳහා පිළිතුරු ලබා දීම
- පාරම්පරික ධීවර කර්මාන්තය පිළිබඳ තොරතුරු රැස් කිරීම සහ ඒවා ධීවර කළමනාකරණය සඳහා යොදා ගැනීමේ ක්‍රමවේද සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

**<u>ධීවර යාත්‍රා රක්ෂණය කිරීම</u>**

ධීවර යාත්‍රා  රක්ෂණය කිරීම 1980 ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීමේ නියෝග අනුව යාන්ත්‍රික ධීවර යාත්‍රා සඳහා අනිවාර්යයෙන් සිදු කළ යුතු ය.

ඒ අනුව, 2014 සිට 2023 දක්වා වසරවල ධීවර යාත්‍රා රක්ෂණය කිරිමේ ප්‍රගතිය සංසන්දනාත්මකව පහතින් දක්වා ඇත.


**රක්ෂණය කරන ලද ධීවර යාත්‍රා සංඛ්‍යාව**




**<u>ධීවර කාර්මිකයින් රක්ෂණය කිරීම</u>**

2023 අංක 01 දරණ යාන්ත්‍රික ධීවර බෝට්ටු පිටත් වීමේ හා පැමිණීමේ නියෝග අනුව ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර කාර්මිකයන් රක්ෂණය කිරීම අනිවාර්යය කර ඇත. මීට පෙර එය නීතියක් බවට පත්ව නොතිබුණ අතර, වර්තමානයේ යාන්ත්‍රික ධීවර යාත්‍රා සඳහා එය අනිවාර්යය වී ඇත.

ඒ අනුව, 2014 සිට 2023 දක්වා වසරවල ධීවර කාර්මිකයින් රක්ෂණය කිරීමේ ප්‍රගතිය සංසන්දනාත්මකව පහතින් දක්වා ඇත.




10. 1 ධීවර කාර්මිකයින්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම

| කාර්යය | ප්‍රගතිය |
|---|---|
| රක්ෂණය කරන ලද සමස්ථ ධීවර යාත්‍රා සංඛ්‍යාව | 29,633 |
| රක්ෂණය කරන ලද සමස්ථ ධීවර කාර්මිකයින් සංඛ්‍යාව | 42,621 |
| ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වූ සංඛ්‍යාව | 1,444 |
| මුහුදු යෝග්‍යතා සහතික නිකුත් කිරීම | 34,731 |
| ධීවර යාත්‍රාංගන ලියාපදිංචි කිරීම | 58 |
| ධීවර ආම්පන්න සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම් | 18 |

11. ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම

**<u>ධීවර රැකුම නව රක්ෂණාවරණය</u>**

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්ණායකයන්ට අනුව, ධීවර වෘත්තිය වඩාත් අභියෝගාත්මක, අනතුරුදායක හා අවදානම් සහගත රැකියාවක් ලෙස නම් කර ඇත. මෙරට ධීවර කර්මාන්තය සැළකීමේ දී කරදිය ධීවර අංශයේ අවධානම මිරිදිය ධීවර අංශයට වඩා ඉහළ අගයක් ගනී. ධීවර අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛනවලට අනුව මෙරට ධීවරයින් සංඛ්‍යාව 315,550ක් වන අතර මින් 223,490ක් කරදිය ධීවර අංශයේ රැකියාවේ නියුක්ත වී සිටින අතර ඉන් 87%ක් පමණ වෙරළාසන්න ධීවරයින් වන අතර 34,300ක් පමණ බහු දින ධීවර යාත්‍රාවලින් අක්වෙරළ හා ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයෙහි නිරත වේ. මෙරට ධීවර පවුල් සංඛ්‍යාව 266,640ක් වන අතර ඍජු ධීවර කර්මාන්තයෙන් යැපෙන්නන් සංඛ්‍යාව 1,123,000ක් පමණ වේ. එමෙන් ම, මෙම අංශයට සම්බන්ධ වක්‍ර රැකියාවේ නිරත වන හා ආශ්‍රිත වෙනත් යැපීම් සලසා ගන්නා

පිරිස ලක්ෂ 06ක් පමණ වන බවට ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවේ සමස්ථ ජන ගහනයෙන් 7.7%ක් පමණ ප්‍රමාණයකට සිය ජීවනෝපාය සලසා ගැනීමට ධීවර කර්මාන්තය ඉවහල් වේ.

ශ්‍රී ලංකාවේ සමස්ථ ක්‍රියාකාරී ධීවර කාර්මිකයින් ප්‍රමාණය 315,550කි. මේ අතුරින්, මෙතෙක් ක්‍රියාත්මකව පැවති රක්ෂණ යෝජනා ක්‍රමයට දායක වූ පිරිස, ක්‍රියාකාරී ධීවර කාර්මික සංඛ්‍යාවෙන් ආසන්නව ගත් කළ 1.73%ක ප්‍රමාණයක් ගනී. පැවති රක්ෂණ යෝජනා ක්‍රමයේ අඩුපාඩු හා ගැටලු හඳුනා ගෙන ධීවර කාර්මිකයින් සඳහා වඩාත් ඵලදායි හා සහනදායී වාරික මුදලකින් යුත් නව රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පැන නැගුණ බැවින් ධීවර අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව එක්ව "ධීවර රැකුම" පුද්ගල හදිසි අනතුරු රක්ෂණය හඳුන්වා දී ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් ක්‍රියාත්මක කරනු ලබන "ධීවර රැකුම" පුද්ගල හදිසි අනතුරු රක්ෂණය යටතේ ධීවර කාර්මික මහතාගේ අභාවයක දී ඔහු වෙනුවෙන් ලැබෙන වන්දි මුදල නීත්‍යානුකූල උරුමක්කරුවන් වෙත ලබා දීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

<u>ධීවර රැකුම රක්ෂණාවරණයේ ආවරණ විස්තර</u>

| ආවරණ විස්තර | රක්ෂිත මුදල (රු.) | | |
|---|---|---|---|
| 01. පුද්ගල හදිසි අනතුරු රක්ෂණය | විකල්ප 01 | විකල්ප 02 | විකල්ප 03 |
| හදිසි අනතුරු රක්ෂණය | 1,200,000 | 1,500,000 | 2,000,000 |
| සදාකාලික පූර්ණ අකර්මන්‍යතාවය | 1,200,000 | 1,500,000 | 2.000,000 |
| සදාකාලික අර්ධ අකර්මන්‍යතාවය | 600,000 | 750,000 | 1,000,000 |
| 02. අතුරුදහන් වීම සඳහා | | | |
| ධීවර කටයුතුවල නිරත වී සිටිය දී සිදුවන හදිසි අනතුරක් හේතුවෙන් ධීවර මහතෙකුගේ අතුරුදහන් වීමක දී ප්‍රතිලාභ ගෙවීම අතුරුදහන් වී මාස 05ක් ගත වූ පසු ආරම්භ කරනු ලබයි. | මසකට 7,500 බැගින් මාස 12ක් දක්වා | මසකට 7,500 බැගින් මාස 12ක් දක්වා | මසකට 7,500 බැගින් මාස 12ක් දක්වා |
| වසරකට වැඩි කාලයක් අතුරුදහන් වුවහොත් රක්ෂිත මුදලින්, ඉහත ගෙවනු ලැබූ වන්දි මුදල අඩු කළ පසු ඉතිරිය ගෙවනු ලබයි. | 1,200,000 | 1,500,000 | 2,000,000 |
| 03. රෝහල් ගත වීමේ දීමනාව<br>හදිසි අනතුරු හෝ අසනීප සඳහා රෝහල් ගත වීම්වල දී එක් ධීවර පවුලකට වර්ෂයකට උපරිම දින 14ක් සඳහා හිමිකම් ගෙවනු ලබයි.<br>ධීවරයා හා කලත්‍රයා - අවු. 18 සිට අවු. 65 දක්වා<br>අවිවාහක හා රැකියා විරහිත ළමුන් - අවු. 21 දක්වා | දිනකට රු. 500/- (උපරිම දින 14) | දිනකට රු. 500/- (උපරිම දින 14) | දිනකට රු. 500/- (උපරිම දින 14) |
| 04. අධ්‍යාපන වියදම් දීමනාව<br>පාසල් යන දරුවන්ගේ අධ්‍යාපන වියදම් සඳහා උපරිම දරුවන් දෙදෙනෙකු සඳහා මසකට රු. 1000ක් බැගින් වර්ෂයක් සඳහා ගෙවනු ලැබේ. | 1,000 | 1,000 | 1,000 |

| | | | |
|---|---|---|---|
| 05. අවමංගල්‍යාධාර ප්‍රතිලාභය (ස්වභාවික මරණ හේතුවෙන් පමණක් ගෙවනු ලබයි.) | 200,000 | 200,000 | 200,000 |
| 06. ගුවන් ටිකට්පත් ආවරණය ධීවර මෙහෙයුම් හේතුවෙන් වෙනත් රටකට ගසා ගෙන යෑම/ අත්අඩංගුවට පත්වීමක දී | 40,000 | 40,000 | 40,000 |

<u>**දියවර දිරිය**</u>


නව තාක්ෂණය හඳුන්වා දීම තුළින් ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමත් ගුණාත්මක තත්ත්වයෙන් යුතු වැඩි මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා ගැනීමත් අරමුණු කර ගනිමින්, ධීවර යාත්‍රා වැඩිදියුණු කිරීම සහ ධීවර ප්‍රජාව සඳහා සහන සැලසීම සඳහා ධීවර අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ලංකා බැංකුව එක්ව දියවර දිරිය අඩු පොළී ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇත.

මේ යටතේ, එක් ප්‍රතිලාභියෙකු සඳහා රුපියල් මිලියන 15ක උපරිමයකට යටත්ව ණය ලබා දෙන අතර පොළී අනුපාත පහත පරිදි වේ.

- ණය මුදල රුපියල් මිලියන 2ට අඩු නම් ණයලාභියාගෙන් අය කරන පොළී අනුපාතය 5%කි.
- ණය මුදල රුපියල් මිලියන 2ට වැඩි නම් ණයලාභියාගෙන් අය කරන පොළී අනුපාතය 7%කි.
- එක් ප්‍රතිලාභියෙකු සඳහා රජය මගින් 4%ක පොළී සහනාධාරයක් මෙම ණය යෝජනා ක්‍රමයට ලබා දේ.
- ධීවර යාත්‍රාංගන වැඩිදියුණු කිරීම, අඩි 55ට වැඩි ධීවර යාත්‍රා නිෂ්පාදනය, නව තාක්ෂණය වැඩි දියුණු කිරීම් (RSW හා CSW), මරුවැල් පන්න හා වින්ච් සවි කිරීම් සඳහා ණය ලබා දීමේ දී ප්‍රමුඛතාව ලබා දේ.
- දියවර දිරිය අදියර එක යටතේ ප්‍රතිලාභීන් 755දෙනෙකු සඳහා රුපියල් බිලියන 1.03ක් පමණ ණය මුදලක් ලබා දී ඇති අතර, දියවර දිරිය අදියර දෙක යටතේ ප්‍රතිලාභීන් 1,017ක් සඳහා රුපියල් බිලියන 1.82ක් පමණ ණය මුදලක් ලබා දී ඇත.

මේ වන විටත්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් මෙහි 4%ක පොළී වාරික මුදල් ලංකා බැංකුව වෙත යොමු කර ගෙවීම් කටයුතු සිදුවෙමින් පවතී.

**දියවර කැකුළු ළමා ඉතුරුම් ගිණුම**




ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්ණායකයන්ට අනුව ධීවර වෘත්තිය වඩාත් අභියෝගාත්මක, අනතුරුදායක හා අවදානම් සහගත රැකියාවක් ලෙස නම් කර ඇත. අතිබහුතරයක් ධීවර කාර්මිකයින්ගේ පවුල්වල ආර්ථිකය සම්පූර්ණයෙන් ම එම පවුලේ ප්‍රධානියා වන ධීවරයා උපයන ආදායම මත රඳා පවතී. එම ධීවර පවුල්වල පෝෂණය, අධ්‍යාපනය, සෞඛ්‍ය ආරක්ෂිතභාවය ද සම්පූර්ණයෙන් ම රඳා පවතින්නේ ද ධීවරයාගේ තනි ආදායම මත ය. ධීවර කාර්මිකයාට සිදුවන අනතුරු නිසා එම පවුලේ ආර්ථිකය සම්පූර්ණයෙන් කඩා වැටීමක් සිදු වන අතර, මෙහි දී, ප්‍රධාන වශයෙන් ධීවර පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය බිඳ වැටීම බහුලව පෙන්නුම් කරයි. ඒ අනුව, ධීවර පවුල්වල සමාජ ආරක්ෂණය තහවුරු කිරීමටත්, ධීවර කර්මාන්තයට තරුණ තරුණියන් ආකර්ෂණය කර ගැනීමටත්, ධීවරයින් තම පවුලේ අනාගතය වෙනුවෙන් ආයෝජන/ ඉතිරි කිරීම් පුරුද්දක් ඇති කිරීම හා අරපිරිමැස්ම ප්‍රවර්ධනය කිරීම සඳහා අප දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී ඇත.

ඒ අනුව, ළමුන් සඳහා වඩාත් පුළුල් ආවරණයක් ලබා දීම සඳහා ධීවර අමාත්‍යාංශයේ ඉල්ලීම මත ලංකා බැංකුව විසින් ධීවර ළමුන් සඳහා ම විශේෂිත වූ 'දියවර කැකුළු' ළමා ඉතුරුම් ගිණුමක් ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
2023 වර්ෂය තුළ දී ළමා ඉතුරුම් ගිණුම් 300කට ආසන්න සංඛ්‍යාවක් ආරම්භ කර ඇත.

## 12. 2023 වර්ෂයේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් සහ එහි ප්‍රගතිය

### 12.1. ධීවර කර්මාන්තය සඳහා ධීවර යාත්‍රා ක්‍රියාත්මක කිරීමට භූමිතෙල් අවශ්‍යතාවය

පිටත සවි කරන ලද එංජින් සහිත යාත්‍රාවලින් වැඩි ප්‍රමාණයක් ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිත කරයි. එනම්, OFRP හා MTRB යාත්‍රාවලින් වැඩි ප්‍රමාණයක් ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිත කරයි. මේ අනුව, දිවයින පුරා ඇති පිටත සවිකරණ එංජින් සහිත MTRB හා OFRP ධීවර යාත්‍රා 27,903ක් මාසය පුරා ම ධීවර

රැකියාවේ යෙදෙන්නේ නම් දිනකට භූමිතෙල් ලීටර් 1,044,974ක් අවශ්‍ය වේ. නමුත්, සාමාන්‍යයෙන් එක් යාත්‍රාවක් මසකට රැකියාවේ යෙදෙන්නේ දින 25ක් ලෙස සළකා ගණනය කළ විට මසක් සඳහා වැය වන භූමිතෙල් ප්‍රමාණය ලීටර් 26,124,350ක් (ලීටර් මිලියන 26.12) පමණ වේ.

ධීවර කර්මාන්තය සඳහා දෛනිකව අවශ්‍ය භූමිතෙල් බෙදා හැරීම සඳහා පිරවුම් හල් 128ක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගෙන ඇති අතර, ධීවර කාර්මිකයින්ට අවශ්‍ය භූමිතෙල් තොග අදාළ පිරවුම්හල් හරහා බෙදා හැරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

12.1.1. ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිත කරන ධීවර යාත්‍රාවල පිටත එංජිම සහිත කුඩා යාත්‍රා (OFRP) හා පාරම්පරික යාන්ත්‍රික යාත්‍රා (MTRB) සඳහා චීන සමූහාණ්ඩු ආධාර යටතේ භූමිතෙල් ලබා දීමේ වැඩසටහන - 2023 [OFRP (Out Board Fiber Reinforced Plastic Boat), MTRB (Mechanized Traditional Boat)]

චීන සමූහාණ්ඩුව මගින් ශ්‍රී ලංකාවේ ධීවර ප්‍රජාවේ ප්‍රයෝජනය සඳහා ආධාර වශයෙන් පිරි නැමුණු ඉන්ධන, එම යාත්‍රා හිමියන් සඳහා නොමිලේ ලබා දීමේ වැඩසටහන 2023.05.23 වන දින පානදුර ධීවර වරායේ දී ධීවර අමාත්‍ය ගරු. ඩග්ලස් දේවානන්දා මැතිතුමා, ධීවර රාජ්‍ය අමාත්‍ය ගරු. පියල් නිශාන්ත ද සිල්වා මැතිතුමා සහ මහජන චීන සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති ගරු. කී ෂෙන්හොංග් (Qi Zhenhong) මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය.

චීන සමූහාණ්ඩුව මගින් ශ්‍රී ලංකාවේ ධීවර ප්‍රජාවේ පරිභෝජනය සඳහා ආධාර වශයෙන් පිරි නැමුණු ඩීසල් ලීටර මිලියන 3.79ක් වෙනුවට කුඩා පරිමාණ ධීවරයින්ගේ පරිභෝජනය සඳහා භූමිතෙල් ලබා දීමට තීරණය කරන ලද අතර, එවකට පැවති මිළ අනුව, භූමිතෙල් ලීටර මිලියන 4.32ක් නිදහස් කිරීමේ හැකියාව පවතින බව නිරීක්ෂණය විය. මෙම ඉන්ධන නිකුත් කිරීම අදියර 02ක් යටතේ සිදු කරනු ලැබී ය. ඒ අනුව, පළමු අදියරේ දී භූමිතෙල් ලීටර 75ක් හා දෙවන අදියරේ දී භූමිතෙල් ලීටර 78ක් බැගින් අදියර දෙක ම අවසානයේ දී එක් ධීවර යාත්‍රාවක් සඳහා භූමිතෙල් ලීටර 153ක් බැගින් ලබා දීමට තීරණය විය.

එමගින්, ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිත කරන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ගත, දිවයින පුරා සක්‍රීය ධීවර කර්මාන්තයේ යෙදෙන OFRP හා MTRB යාත්‍රා සඳහා එම සහනය ලබා දීමට අපේක්ෂා කරන ලදී. ඒ අනුව, කොළඹ, කළුතර, ගාල්ල, මාතර, තංගල්ල, කල්මුණේ, මඩකලපුව, ත්‍රිකුණාමලය, කිලිනොච්චි, යාපනය, මුලතිව්, මන්නාරම, පුත්තලම, හලාවත හා මීගමුව යන ධීවර දිස්ත්‍රික්ක 15හි මේ වන විට සක්‍රීය ධීවර යාත්‍රා ලෙස හඳුනා ගත් යාත්‍රා 25 564ක් සඳහා පළමු අදියර යටතේ ද, යාත්‍රා 28,806ක් සඳහා දෙවන අදියර යටතේ ද එම සහනය ලබා දීමට අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව, පළමු අදියර යටතේ ඉන්ධන නිකුත් කිරීම ඉන්ධන පිරවුම්හල් 96ක් මගින් සිදු කරනු ලැබූ අතර, එක් යාත්‍රාවකට ලීටර් 75ක් බැගින් OFRP හා MTRB යාත්‍රා 24,340ක් සඳහා භූමිතෙල් ලීටර් 1,825,500ක් නිකුත් කිරීම සිදු කරන ලදී.

දෙවන අදියර යටතේ ඉන්ධන, ඉන්ධන පිරවුම්හල් 97ක් මගින් නිකුත් කරනු ලැබූ අතර, එක් යාත්‍රාවකට ලීටර් 78ක් බැගින් OFRP හා MTRB යාත්‍රා 23,850ක් සඳහා භූමිතෙල් ලීටර් 1,860,300ක් නිකුත් කරන ලද අතර, පළමු අදියරයේ දී ඉන්ධන නිකුත් නොකරන ලද යාත්‍රා සඳහා එක් යාත්‍රාවකට ලීටර් 153ක් බැගින් OFRP හා MTRB යාත්‍රා 3,864ක් සඳහා භූමිතෙල් ලීටර් 591,192ක් නිකුත් කිරීම සිදු කරන ලදී. ඒ අනුව, යාත්‍රා 27,714ක් සඳහා භූමිතෙල් ලීටර 2,451,492ක් දෙවන අදියර යටතේ 2023.12.31 දින වන විට බෙදා හැරීම සිදු කර ඇත.

ඒ අනුව, 2023 වර්ෂය තුළ දී පළමු හා දෙවන අදියරයන් යටතේ ධීවර දිස්ත්‍රික්ක 15ක් සඳහා භූමිතෙල් ලීටර 4,276,992ක් බෙදා හැරීම සිදු කර ඇත.

<u>**පළමු හා දෙවන අදියරයන් යටතේ භූමිතෙල් බෙදා හැරීම**</u>

| **OFRP සහ MTRB ධීවර යාත්‍රා සඳහා භූමිතෙල් සහනාධාරය ලබා දීමේ වැඩසටහන - 2023** | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | පළමු අදියර | | දෙවන අදියර | | | | | | |
| | | | භූමිතෙල් නිකුත් කරනු ලැබීමට අනුමැතිය ලබා දී ඇති ධීවර යාත්‍රා සංඛ්‍යාව | | | **2023.12.31** දක්වා භූමිතෙල් ලැබී ඇති මුළු ධීවර බෝට්ටු සංඛ්‍යාව | | | |
| | භූමිතෙල් නිකුත් කරනු ලැබීමට අනුමැතිය ලබා දී ඇති ධීවර යාත්‍රා සංඛ්‍යාව | භූමිතෙල් ලැබී ඇති මුළු ධීවර යාත්‍රා සංඛ්‍යාව | **78 (L)** | **153 (L)** | මුළු ධීවර යාත්‍රා සංඛ්‍යාව (අනුමත) | **78 (L)** | **153 (L)** | මුළු ධීවර බෝට්ටු සංඛ්‍යාව (නිකුත් කරන ලද) | නිකුත් කිරීමට නියමිත මුළු යාත්‍රා සංඛ්‍යාව **Kerosene** |
| මඩකලපුව | 1,796 | 1,725 | 1,727 | 124 | 1,851 | 1,704 | 106 | 1,810 | 41 |
| කොළඹ | 364 | 291 | 291 | 116 | 407 | 287 | 110 | 397 | 10 |
| හලාවත | 1,669 | 1,430 | 1,428 | 449 | 1,877 | 1,391 | 389 | 1,780 | 97 |
| ගාල්ල | 702 | 691 | 691 | 110 | 801 | 678 | 105 | 783 | 18 |
| යාපනය | 5,478 | 5,282 | 5,283 | 642 | 5,925 | 5,265 | 611 | 5,876 | 49 |
| කිලිනොච්චිය | 1,045 | 1,021 | 1,020 | 140 | 1,160 | 1,009 | 135 | 1,144 | 16 |
| කළුතර | 418 | 412 | 412 | 42 | 454 | 408 | 42 | 450 | 4 |
| කල්මුණේ | 1,000 | 973 | 973 | 156 | 1,129 | 966 | 135 | 1,101 | 28 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| මන්නාරම | 2,431 | 2,309 | 2,310 | 714 | 3,024 | 2,171 | 541 | 2,712 | 312 |
| මාතර | 1,015 | 982 | 982 | 76 | 1,058 | 960 | 66 | 1,026 | 32 |
| තංගල්ල | 966 | 946 | 946 | 101 | 1,047 | 938 | 98 | 1,036 | 11 |
| ත්‍රිකුණාමලය | 3,545 | 3,537 | 3,541 | 380 | 3,921 | 3,502 | 336 | 3,838 | 83 |
| පුත්තලම | 2,617 | 2,502 | 2,496 | 598 | 3,094 | 2,374 | 440 | 2,814 | 280 |
| මීගමුව | 1,405 | 1,207 | 1,208 | 357 | 1,565 | 1,181 | 334 | 1,515 | 50 |
| මුලතිව් | 1,113 | 1,032 | 1,032 | 461 | 1,493 | 1,016 | 416 | 1,432 | 61 |
| **එකතුව** | **25,564** | **24,340** | **24,340** | **4,466** | **28,806** | **23,850** | **3,864** | **27,714** | **1,092** |

12.2. යාන්ත්‍රික නොවන සාම්ප්‍රදායික යාත්‍රා හිමියන් (NTRB) වෙත ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් ජීවනාධාරයක් ලබා දීමේ වැඩසටහන

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අඩු ආදායම්ලාභී ධීවර කාර්මිකයින් වෙත සහන සැලසීමේ අරමුණින් ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය වෙත ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනා අතරින් එක් යෝජනාවක් වන NTRB යාත්‍රා හිමියන් වෙත මාස 03ක කාලයක් සඳහා ජීවනාධාරයක් ලබා දීමේ වැඩසටහන සඳහා අනුග්‍රහය දැක්වීමට එම සංවිධානයේ එකඟත්වය පළ විය. ඒ අනුව, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රධාන අදියර 02ක් යටතේ සිදු වූ අතර, මුළු ප්‍රතිලාභීන් 11,794ක් සඳහා ජීවනාධාරය ලබා දෙන ලදී.

මෙහි පළමු අදියර යටතේ මඩකලපුව, යාපනය, මුලතිව්, කිලිනොච්චි, කල්මුණේ හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල යාන්ත්‍රික නොවන පාරම්පරික යාත්‍රා හිමියන් 6,947ක් වෙත එක් ප්‍රතිලාභියෙකුට ඇමෙරිකානු ඩොලර් 42ක් බැගින් මාස 03ක කාලයක් සඳහා ජීවනාධාරය ලබා දීම සිදු කරන ලදී.

මෙහි දෙවන අදියර යටතේ හලාවත, කොළඹ, මන්නාරම, පුත්තලම, ගාල්ල, කළුතර, මාතර, මීගමුව හා තංගල්ල යන දිස්ත්‍රික්කවල යාන්ත්‍රික නොවන සාම්ප්‍රදායික යාත්‍රා හිමියන් 4,847ක් වෙත එක් ප්‍රතිලාභියෙකුට ඇමෙරිකානු ඩොලර් 47ක් බැගින් මාස 03ක කාලයක් සඳහා ජීවනාධාරය ලබා දීම සිදු කරන ලදී.

<u>පළමු අදියර</u>

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | එකතු කළ ප්‍රතිලාභීන් | මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව | **CERF** හරහා මාරු කරන ලද සමස්ථ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | මඩකලපුව | 4,036 | 66 | 4,102 | 4,010 |
| 2 | යාපනය | 993 | 32 | 1,025 | 1,017 |
| 3 | මුලතිව් | 236 | 15 | 251 | 235 |
| 4 | කිලිනොච්චිය | 221 | 60 | 281 | 277 |
| 5 | කල්මුණේ | 629 | 0 | 629 | 626 |
| 6 | ත්‍රිකුණාමලය | 783 | 0 | 783 | 782 |
| එකතුව | | **6,898** | **173** | **7,071** | **6,947** |

<u>දෙවන අදියර</u>

| අංකය | දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් කාර්යාල මගින් නිකුත් කරන ලද මුළු ලැයිස්තු | නිවැරදි කිරීමෙන් අනතුරුව **FAO** (ලෝ. ආ. කෘෂි සංවිධානය) වෙත යොමු කරන ලද අවසන් ලැයිස්තුව | පළමු අදියර | දෙවන අදියර | පළමු හා දෙවන අදියරේ දත්ත ගැලපීම සහිත මුළු ප්‍රතිලාභීන් | **CERF** හරහා මාරු කරන ලද සමස්ථ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 1 | හලාවත | 1,086 | 1,084 | 84 | 87 | 1,255 | 1,222 |
| 2 | කොළඹ | 85 | 85 | 0 | 0 | 85 | 84 |
| 3 | මන්නාරම | 339 | 308 | 0 | 0 | 308 | 298 |
| 4 | පුත්තලම | 698 | 693 | 0 | 61 | 754 | 726 |
| 5 | ගාල්ල | 163 | 162 | 0 | 19 | 181 | 180 |
| 6 | කළුතර | 199 | 199 | 0 | 26 | 225 | 224 |
| 7 | මාතර | 195 | 193 | 3 | 33 | 229 | 220 |
| 8 | මීගමුව | 1,610 | 1,607 | 62 | 6 | 1,675 | 1,623 |
| 9 | තංගල්ල | 255 | 251 | 12 | 9 | 272 | 270 |
| | **එකතුව** | **4,630** | **4,582** | **161** | **241** | **4,984** | **4,847** |

12.3. ධීවර කර්මාන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම - (කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ බටහිර පර්යන්තය සංවර්ධනය සඳහා වැලි ලබා ගැනීම හේතුවෙන් ධීවර කාර්මිකයන්ට සිදු වූ බලපෑම අවම කිරීම)

කොළඹ වරාය බටහිර පර්යන්තය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අදාළව ධීවර කාර්මිකයන්ට සිදු වූ බලපෑම අවම කිරීම සඳහා ධීවර කර්මාන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 140ක

මුදලක් ධීවර අමාත්‍යාංශය වෙත ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා බටහිර පර්යන්ත සංවර්ධන සමාගම මගින් ලබා දී ඇත.

මේ වන විට, එම මුදල ධීවර අමාත්‍යාංශය වෙත ලබා දී ඇති අතර එම මුදල්, මෙම ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්වන ගම්පහ හා කොළඹ දිස්ත්‍රික්කවල ධීවර යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා යෙදවීමට නියමිත ය. ඒ සඳහා, සුදුසු ව්‍යාපෘති මේ වන විට හඳුනා ගනිමින් හා ක්‍රියාත්මක කරමින් පවතී.

ඒ අනුව, වත්තල ලුනාව මෝය තොටුපල දියකඩනය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති අතර, මීගමුව ධීවර දිස්ත්‍රික්කයේ කුඩා පරිමාණ ධීවරයින් 25 දෙනෙකුට තෙප්පම් ලබා දීමේ ව්‍යාපෘතිය සඳහා තෙප්පම් නිෂ්පාදන කටයුතු සිදු කිරීම සඳහා ඇනවුම් ප්‍රදානය කර ඇත.

## 12.4 ධීවර හැඳුනුම්පත් නිකුත් කිරීම

ධීවර කර්මාන්තයේ නියැලෙන ධීවර ප්‍රජාවගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ධීවර හැඳුනුම්පත් සහ යාත්‍රා නියමු බලපත්‍ර නිකුත් කිරීම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සංවර්ධන අංශය විසින් සිදු කරනු ලබයි.

2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා සංවර්ධන අංශය විසින් නිකුත් කර ඇති ධීවර හැඳුනුම්පත් සහ යාත්‍රා නියමු බලපත්‍ර පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

නිකුත් කර ඇති මුළු ධීවර හැඳුනුම්පත් සංඛ්‍යාව - 2,603
නිකුත් කර ඇති මුළු යාත්‍රා නියමු බලපත්‍ර සංඛ්‍යාව - 1,485

## 12.5. වෙරළාශ්‍රිත මුහුදු තීරයේ මත්ස්‍ය ගහනය වැඩි කිරීම සඳහා අබලි වාහන භාවිතයෙන් ඇටවුම් යෙදවීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය

සමුද්‍රීය පරිසර පද්ධතිය, සමුද්‍රීය ජෛව විවිධත්වය අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කරලීම උදෙසා සමුද්‍රීය ජෛව විවිධත්වය ඉහළ නැංවීම සඳහා වෙරළාසන්න මුහුදු පත්ලෙහි කෘතිම උපස්ථර මත මත්ස්‍ය අභිජනන ස්ථාන ඇති කිරීම අරමුණු කර ගෙන භාවිතයෙන් ඉවත් කළ බහුදින ධීවර යාත්‍රා, දුම්රිය මැදිරි සහ බස්රථ කෘතිම උපස්ථර ලෙස යොදා ගැනීම සිදු කරනු ලැබේ. ඒ අනුව, 2021, 2022 සහ 2023 වර්ෂවල දී භාවිතයෙන් ඉවත් කළ බහුදින ධීවර යාත්‍රා සහ බස්රථ සැකිලි විශාල ප්‍රමාණයක් පරිසරයට හානියක් නොවන සේ සාගරයේ තැන්පත් කර කෘතිම උපස්ථර නිර්මාණය කිරීම සිදු කරන ලදී.

2021 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය ගාල්ල, මාතර සහ යාපනය දිස්ත්‍රික්කවල සිදු කරන ලදී. 2022 වර්ෂයේ දී දෙවන අදියර ලෙස මෙම ව්‍යාපෘතිය යාපනය දිස්ත්‍රික්කයේ සිදු කිරීම සඳහා දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 11.3ක මුදලක් වෙන් වූ අතර, අමාත්‍යාංශ ප්‍රතිපාදන මගින්, ඒ සඳහා අවශ්‍ය ඉතිරි රුපියල් මිලියන

24ක මුදල වෙන් විය. ඒ අනුව, 2022 වර්ෂය අවසාන වන විට බස්රථ 47ක් මිළ දී ගෙන කන්කසන්තුරේ දක්වා ප්‍රවාහනය කරන ලදී.

2023 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 30ක මුදලක් වෙන් වූ අතර, වර්ෂයේ මුල් කාර්තුව තුළ දී එම ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ බස්රථ 47ක් යාපනය දිස්ත්‍රික්කයට අයත් වෙරළාශ්‍රිත මුහුදු තීරයේ ගිල්වීමට කටයුතු කරන ලද අතර ඒ සඳහා රුපියල් මිලියන 20.22ක් වැය කර ඇත.

**<u>කෘතිම උපස්ථරයක් ලෙස ගර්භිත බස්රථ සාගරයේ තැන්පත් කිරීමෙන් පසු ඒ මත මත්ස්‍ය ගහනය වර්ධනය වී ඇති අයුරු දැක්වෙන ඡායාරූප</u>**










12.5. කලපු සංවර්ධනය

12.5.1. පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම කලපුව ගැසට් කිරීම

2010 අගෝස්තු 04 වන දින අංක 1665/17 දරණ අංක යටතේ පුත්තලම කලපුව කළමනාකරණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. 2013 අංක 35 දරණ සංශෝධිත ධීවර හා ජලජ සම්පත් පනතේ ප්‍රතිපාදනවලට අනුව පුත්තලම කලපු පරිසර පද්ධතියේ සංරක්ෂණ, සංවර්ධන හා කළමනාකරණය හා

ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා නැවත GPS පාඨාංක සහිතව ගැසට් කිරීමට අවශ්‍ය කටයුතු නීති අංශය විසින් සිදු කරමින් පවතී.

12.5.2. පුත්තලම කලපු ධීවර කළමනාකරණ සහසහභාගිත්ව කමිටු රැස්වීම පැවැත්වීම

ඒ අනුව, 2013 අංක 35 දරණ 1996 අංක 02 දරණ සංශෝධිත පනතට අනුව, ධීවර හා ජලජ සම්පත් පනතට අනුව 31(අ) ප්‍රකාරව පුත්තලම කලපු ධීවර කළමනාකරණ ප්‍රදේශයේ සංරක්ෂණය, කළමනාකරණය, ආරක්ෂාව හා පාලනය බලාත්මක කර පවත්වා ගෙන යාම සඳහා පුත්තලම සහසහභාගිත්ව කමිටුව 2023.01.17 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.

12.5.3. ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

2023 වර්ෂයේ පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම කලපුවේ කලපු කළමනාකරණ කමිටුවල ඉදිරි ක්‍රියාකාරීත්වය හා ධීවර ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම පිළිබඳ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන් 08ක් පවත්වන ලද අතර, හලාවත කලපුවේ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන් 04ක් පවත්වන ලදී. තවද, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ලංකාපටුන කලපුවේ කලපු කළමනාකරණ කමිටු 06ක් ප්‍රතිසංවිධානය කරන ලදී. මුලතිව් දිස්ත්‍රික්කයේ නන්දිකඩාල් කලපුවේ කලපු කළමනාකරණ කමිටු 02ක් ප්‍රතිසංවිධානය කරන ලදී.

12.5.4. හලාවත කොග්ගල හා ගරාඬුව යන කලපුවල ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම ගැසට් කිරීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු කෙරෙමින් පවතී.

ගාල්ල දිස්ත්‍රික්කයේ කොග්ගල කලපුවත්, මාතර දිස්ත්‍රික්කයේ පිහිටි ගරාඬුව කලපුවත් සහ මහවැව ධීවර දිස්ත්‍රික්කයේ පිහිටි හලාවත කලපුවත් එම කලපු පරිසර පද්ධතියේ පාරිසරික තත්ත්වයන් තිරසාරව පවත්වා ගැනීමටත් ඒ තුළින් කලපුව ආශ්‍රිතව සිදු කරන්නා වූ ජීවනෝපායන් සුරක්ෂිත කිරීම අරමුණු කර ගෙන මෙම ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම ගැසට් කිරීමට නියමිත ය.

12.5.5. මහවැව දිස්ත්‍රික්කයේ හලාවත කලපුවේ මායිම් කණු සිටුවීම

මහවැව ධීවර දිස්ත්‍රික්කයේ හලාවත කලපුවේ මායිම් කණු 283ක්, 2023.03.30 වන දින සිට 2023.04.18 වන දින දක්වා කාලය අතරතුර සිටුවා අවසන් කර ඇත.

12.5.6. හලාවත කලපු සංරක්ෂණය හා සංවර්ධනය කිරීම

හලාවත කලපු සංරක්ෂණය හා සංවර්ධනය කිරීමේ අරමුණින් හලාවත කලපුව ආශ්‍රිතව පවතින ඉස්සන් ගොවිපලවල්වල අවසාදිත පොකුණු අධීක්ෂණය ධීවර අමාත්‍යාංශය හා ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හා ඒකාබද්ධව සිදු කරන ලදී.

**<u>2.2. අභියෝග</u>**

1. ඇතැම් නිලධාරීන්ගේ නව තාක්ෂණය භාවිතයට ඇති පසුගාමීත්වය
2. විදේශ මුදල් හිඟය නිසා යාත්‍රා නිරීක්ෂණ පද්ධතියෙහි (VMS) බිල්පත් ගෙවීමේ අපහසුතාවය මතු වීම

3. නිලධාරීන් විදේශගත වීම සඳහා යොමු වීම

## 2.3. ඉදිරි ඉලක්ක

1. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා මෙහෙයුම් පද්ධතියක් හඳුන්වා දීම
2. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ මූලික පරිගණක දැනුම යාවත්කාලීන කිරීම
3. ගමන් වාර 10000ක් වෙනුවෙන් ධීවරයින් සඳහා ඊ-ලොග් යෙදූම ක්‍රියාත්මක කිරීම
4. LOG සටහන් දත්ත ඇතුළත් කිරීම සඳහා පද්ධතියක් හඳුන්වා දීම
5. MSDFAR ප්‍රචාරක කටයුතු සඳහා වැඩසටනක් ක්‍රියාත්මක කිරීම
6. යාත්‍රා නිරීක්ෂණ පද්ධතියේ (VMS) ප්‍රචාරක කටයුතු සඳහා වැඩසටනක් දියත් කිරීම
7. නව මෘදුකාංගයක් මගින් යාත්‍රා පිටත් වීම හා යාත්‍රා පැමිණීම කළමනාකරණය කිරීම

# 03. පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන

## සමස්ථ මූල්‍ය කාර්යසාධනය

### 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

**2023.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| අයවැය 2023 | | සටහන | තතය 2023 | 2022 | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| 186,779,500 | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | 179,170,315 | 185,602,364 | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| 186,779,500 | මුළු ආදායම් ලැබීම් (අ) | | **179,170,315** | **185,602,364** | |
| | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 400,637,299 | 513,882,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 225,239,292 | 141,474,293 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 32,454,828 | 29,601,674 | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | **658,331,418** | **684,957,967** | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | **837,501,733** | **870,560,331** | |
| | භාණ්ඩාගාර ප්‍රේෂණ (ඈ) | | - | - | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ=(ඇ)-(ඈ) | | **837,501,733** | **870,560,331** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | - | - | ඒසීඒ-2(ii) |
| 573,600,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 541,509,993 | 523,811,430 | |
| 347,609,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | **6** | 334,802,171 | 106,739,117 | |
| 47,562,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම් | **7** | 21,230,218 | 63,013,496 | |
| - | පොලී ගෙවීම් | 8 | - | - | |
| 1,065,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 1,057,034 | 54,000 | |
| **969,836,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **898,599,417** | **693,618,043** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මූලධන වියදම් | | | | |
| 38,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 27,063,949 | 9,328,347 | ඒසීඒ-2(ii) |
| 649,779,795 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 649,101,479 | 281,525,328 | ඒසීඒ-2(ii) |
| 1,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | 912,900 | 457,100 | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | ඒසීඒ-2(ii) |
| 2,100,000 | හැකියා වර්ධනය | **14** | 2,089,586 | 907,378 | ඒසීඒ-2(ii) |
| 30,000,000 | වෙනත් මූලධන වියදම් | **15** | 20,429,193 | 2,753,819 | ඒසීඒ-2(ii) |
| **720,879,795** | **මුළු මූලධන වියදම් (උ)** | | **699,597,107** | **294,971,971** | |
| | තැන්පතු ගෙවීම් | | 97,128,641 | 132,790,655 | ඒසීඒ- 4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 26,495,786 | 24,693,580 | ඒසීඒ- 5 |
| | **වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්** | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **123,624,428** | **157,484,235** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **1,721,820,951** | **1,146,074,249** | |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ= (ඉ-එ) | | **(884,319,218)** | **(275,513,918)** | |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | - | - | ඒසඒ- 7 |
| - | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | ඒසීඒ- 3 |

## 3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**2023 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය** **ඒසීඒ-පී**

| | සටහන | තතය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 2,160,107,046 | 1,470,200,079 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 64,000,956 | 69,959,998 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **2,224,108,002** | **1,540,160,077** |
| **ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (167,262,494) | (33,192,802) |
| දේපළ, පිරියත හා උපකරණ සංචිතය | | 2,160,107,046 | 1,470,200,079 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | - |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 231,263,450 | 103,152,800 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | 2,224,108,002 | 1,540,160,077 |

[illegible]

## 3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ-සී**

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තතය 2023 රු. | 2022 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 179,348,915 | 185,602,364 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | 30,826,439 |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම | 32,640,661 | 23,511,492 |
| අග්‍රිම ලැබීම් | 477,521,000 | 513,882,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 23,659,038 | 29,004,905 |
| තැන්පතු ලැබීම් | 225,239,292 | 141,474,293 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **938,408,905** | **924,301,493** |
| **අඩුකළා. මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 665,519,090 | 630,527,968 |
| සහනාධාර සහ මාරුකිරීම් | 21,230,218 | 62,537,096 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම් | 6,531,334 | 73,684,427 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 76,883,701 | - |
| අත්තිකාරම් ගෙවීම් | 19,999,828 | 24,761,346 |
| තැන්පතු ගෙවීම් | 97,128,641 | 132,790,655 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **887,292,813** | **924,301,493** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | 51,116,092 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොලී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **-** | **-** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| මූලධන වියදම් | 51,116,092 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **51,116,092** | **-** |

| | | |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | (51,116,092) | - |
| **(උ)=( ඇ) + (ඊ)** | | |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| **<u>අඩුකළා: මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

## <u>3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්</u>

**වාර්තා කිරීමේ පදනම**

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නත ම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනා ගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනා ගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථා වල දී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

## 3.6. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | සංශෝධිත ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසන් ආදායම් ඇස්තමේන්තුවේ %ක් ලෙස |
| 10.03.07.06 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට අදාළ බලපත්‍ර ගාස්තු | 144,830,500 | 186,779,500 | 41,949,000 | 28.96 |

## 3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදනය | | තථ්‍ය වියදම | උපයෝගී කරන ලද ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ %ක් ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 785,000,000 | 969,836,000 | 898,599,417 | **92.65** |
| ප්‍රාග්ධන | 75,000,000 | 720,879,795 | 699,597,107 | **97.04** |

**3.8 මු. රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරනු ලබන ප්‍රතිපාදන**

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල %ක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 151-02-03-78-2506 | ධීවර අමාත්‍යාංශය | කපලු කණු සිටුවීම හා ප්‍රවාහනය | 751,400.00 | 751,400.00 | 960,435.00 | 63 |
| | | ධීවරයින් දැනුවත් කිරීම | 775,750.00 | 775,750.00 | | |
| 151-02-03-80-2202 | ධීවර අමාත්‍යාංශය | ධීවර අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය | 3,615,000.00 | 3,615,000.00 | 2,994,853.75 | 83 |
| 130-1-2-0-1001 130-1-2-0-1003 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | ශ්‍රී.ලං.තො.ස. තාක්ෂණ සේවයේ නිලධාරීන්ට සේවාරම්භක පුහුණු කාල සීමාවේ වැටුප් හා දීමනා ගෙවීම වෙනත් දීමනා | 21,505.00 | 21,505.00 | 21,505.00 | 100 |
| 130-01-02-0-1003 | | | 8,265 | 8,265 | 8,265 | 100 |
| 334-01-01-1003 | බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව | කා.සේ.සේ. පත්වීම් සඳහා වැටුප් හා දීමනා ගෙවීම | 767,903.23 | 767,903.23 | 767,903.23 | 100 |
| 253-01-02-04-1502-12 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | අත්තිකාරම් බී. ගිණුමට අදාළව ණය ශේෂ පියවීම | 1,778,372.24 | 1,778,372.24 | 1,778,372.24 | 100 |

## 3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 2023.12.31 දිනට මූල්‍ය භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.) | 2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.) | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය %ක් ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| **9151** | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 555,058,490.38 | 555,058,490.38 | - | - |
| **9152** | යන්ත්‍රෝපකරණ | 1,213,862,112.72 | 1,213,862,112.72 | - | - |
| **9153** | ඉඩම් | 369,266,000.00 | 369,266,000.00 | - | - |
| **9154** | අස්පෘශ්‍ය වත්කම් | 21,920,443.02 | 21,920,443.02 | - | - |
| **9155** | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| **9160** | කෙරී ගෙන යන වැඩ | - | - | - | - |
| **9180** | බදු දෙන වත්කම් | - | - | - | - |

## 3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතු ය.

අවසාන විගණන වාර්තාව මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාව අවසානයේ දක්වා ඇත.

# 04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% -90% | 89% - 75% | 74% - 50% |
| 1. ස්වාභාවික අනතුරු සඳහා වන්දි ලබා දීම | | | √ |
| 2. වෙරළාසන්න මුහුදු තීරයේ මත්ස්‍ය ගහනය වැඩි කිරීම සඳහා අබලි වාහන භාවිතයෙන් ඇටවුම් යෙදවීම | | | √ |
| 3. ධීවර අංශය පිළිබඳ දැනුවත් කිරීමේ ඒකාබද්ධ වැඩසටහන | √ | | |
| 4. සුළුපන්න (OFRP / NTRB) ධීවර රැකියා සුරක්ෂිත කිරීම හා ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට අදාළව ධීවර කර්මාන්තය සඳහා ඉන්ධන සහනාධාර ලබා දීම | √ | | |
| 5. මහ මුහුදේ ධීවර කර්මාන්තයට එක් වූ බහුදින යාත්‍රා සඳහා යාත්‍රා නිරීක්ෂණ උපකරණ සවි කිරීම, නඩත්තුව, අවශ්‍ය විට දී ඉවත් කිරීම සහ නැවත සවි කිරීම | √ | | |
| 6. යාත්‍රා නිරීක්ෂණ අංශයේ හා ඊට සම්බන්ධිත අනෙකුත් අංශවල නිලධාරීන් පුහුණු කිරීම | √ | | |
| 7. පෙ.ව.7.00, ප.ව.2.00 සහ ප.ව.10.00ට පහත සඳහන් තොරතුරු යටතේ වාර්තා ලබා ගැනීම | √ | | |
| 8. ධීවර යාත්‍රා වරායට පැමිණීම පිළිබඳ වාර්තා සහ එක් එක් බෝට්ටුවේ සිතියම් ලබා ගැනීම | √ | | |
| 9. කිලෝ මීටර් 48ක් ඇතුළත වරාය සීමාවට ළඟා වන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබා ගැනීම | √ | | |
| 10. දේශසීමාවන් උල්ලංඝනය කරමින් ගමන් කරන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබා ගැනීම | √ | | |
| 11. වරායෙන් පිටත්වන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබා ගැනීම | √ | | |
| 12. යාත්‍රාවල බැටරි විසන්ධි කිරීම් පිළිබඳ වාර්තා ලබා ගැනීම | √ | | |
| 13. බැටරිය විසන්ධි වූ යාත්‍රාවල ඇතුළත බැටරියේ විසන්ධි වීම පිළිබඳ වාර්තා ලබා ගැනීම | √ | | |
| 14. යාත්‍රාවල නැවත බැටරිය යථා තත්ත්වයට පැමිණීම පිළිබඳ වාර්තා ලබා ගැනීම | √ | | |
| 15. කාල පරාසයක් තුළ ක්‍රියා විරහිතව ඇති යාත්‍රා පිළිබඳ වාර්තා ලබා ගැනීම | √ | | |
| 16. යාවත්කාලීන කළ සියලු යාත්‍රාවන්ගේ පිහිටීම් අන්තර්ජාතික ඒකකය වෙත ලබා දීම | √ | | |
| 17. ආපදාවට ලක් වූ යාත්‍රා හඳුනා ගැනීම සහ තොරතුරු සෝදිසි මෙහෙයුම් අංශය වෙත ලබා දීම | √ | | |
| 18. මහ මුහුදේ ධීවර මෙහෙයුම් සිදු කරන යාත්‍රාවල තොරතුරු ගෙන්වා ගැනීම හා කළමනාකරණය | √ | | |
| 19. මහ මුහුදේ ධීවර මෙහෙයුම් සිදු කරන යාත්‍රාවල තොරතුරු සත්‍යාපනය කිරීම | √ | | |
| 20. ලොග් වාර්තා දත්ත ගබඩාවට ඇතුළත් කිරීම හා කළමනාකරණය | √ | | |

| | | | |
|---|---|---|---|
| 21. තොරතුරු විමර්ශනය කිරීම හා නීති මගින් කටයුතු කිරීම | √ | | |
| 22. ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ සන්නිවේදන පහසුකම් ලබා දීම | √ | | |
| 23. ධීවර යාත්‍රාවල සන්නිවේදන කටයුතු සඳහා බලපත්‍ර හා ඇමතුම් සංඥා ලබා දීමට කටයුතු කිරීම | √ | | |
| 24. ධීවර කාර්මිකයින් හා යාත්‍රාවන් සම්බන්ධ අනතුරුවල දී රක්ෂණය සඳහා තොරතුරු සනාථ කර දීම | √ | | |
| 25. විදේශීය රටවල දී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදා ගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම | √ | | |
| 26. අන්තර්ජාතික මුහුදු සීමාවන්හී පාවියමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම | √ | | |
| 27. කුඩා හා එක්දින යාත්‍රා සඳහා සන්නිවේදන පහසුකම් ලබා දීම හා ධීවර ප්‍රජාව දැනුවත් කිරීම | √ | | |
| 28. දිනපතා කාලගුණ වාර්තා හා අයහපත් කාලගුණික පූර්ව තොරතුරු දෛනිකව ලබා දීම | √ | | |
| 29. යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මගින් ලබා දෙන තොරතුරු අනුව යාත්‍රා දැනුවත් කිරීම | √ | | |
| 30. අනවසර විදේශීය ධීවර යාත්‍රා හා කාර්මිකයින් පිළිබඳ අදාළ ආයතන දැනුවත් කිරීම | √ | | |
| 31. අනතුරුවලට පත්වන ධීවර කාර්මිකයින් හා යාත්‍රා බේරා ගැනීම් සිදු කිරීම | √ | | |
| 32. ඉන්දියනු සාගර ටූනා කොමිසම (IOTC), ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO), යුරෝපා සංගමය (EU) වැනි ජාත්‍යන්තර ආයතන සඳහා කාලීන වාර්තා සැපයීම සහ වාර්ෂික රැස්වීම් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම | √ | | |
| 33. යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය (VMS) පිළිබඳ ප්‍රචාරණ වැඩසටහනක් දියත් කිරීම | | √ | |
| 34. දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලය පුහුණු කිරීම - තොරතුරු තාක්ෂණ පදනම | √ | | |
| 35. සර්වර් පද්ධතියේ ආරක්ෂාව පිළිබඳ ක්‍රියා කිරීම | √ | | |
| 36. ධීවරයින් සඳහා ඊ-ලොග් යෙදුම ක්‍රියාත්මක කිරීම | √ | | |
| 37. දෙපාර්තමේන්තුවේ දත්ත විශ්ලේෂණය සඳහා “R” සංඛ්‍යාලේඛන භාෂාව හඳුන්වා දීම | | √ | |
| 38. OFRP, MTRB සහ NTRB යාත්‍රා පද්ධතිය හරහා ලියාපදිංචිය ආරම්භ කිරීම | √ | | |
| 39. Doxpro පද්ධතියේ භාවිතය පුළුල් කිරීම | √ | | |
| 40. BLUE TRACKER පද්ධතියට නිලධාරීන් පුහුණු කරවීම | | √ | |
| 41. Alert Management පද්ධතියක් හඳුන්වා දීම | | √ | |
| 42. කලාපීය Fishing Monitoring Center නමින් එකමුතුවක් ආරම්භ කිරීම | | √ | |
| 43. යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය පවත්වා ගැනීම | √ | | |
| 44. පරීක්ෂණ හා අධීක්ෂණ. | | | |
| • අපනයන මත්ස්‍ය පිරිසැකසුම් ආයතන පරීක්ෂණ සංඛ්‍යාව | | √ | |
| • නිල සාම්පල ලබා ගැනීම - ආයතන | | | √ |
| • ඉස්සන් වගා ගොවිපල පරීක්ෂාව | √ | | |
| • ප්‍රතිඅපනයනය සඳහා ආනයනය කරනු ලබන මත්ස්‍ය | | | √ |

| | | | |
|---|---|---|---|
| තොග පිළිබඳව පරීක්ෂණ සිදු කිරීම | | | |
| 45. **අනුමත කිරීම් සහ සහතික කිරීම්** | | | |
| • නව මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන අනුමත කිරීම හා මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන ලියාපදිංචිය යාවත්කාලීන කිරීම | √ | | |
| • අපනයනය සඳහා ස්වස්ථතා සහතික නිකුත් කිරීම | √ | | |
| • මසුන් ඇල්ලීමේ සහතික නිකුත් කිරීම | √ | | |
| 46. **ජලජීවී වගා අවශේෂ අධීක්ෂණ ජාතික වැඩසටහන** | | | |
| • ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන පරීක්ෂාව | √ | | |
| • ජලජීවී වගා ගොවිපල ක්ෂේත්‍ර පරීක්ෂාව | √ | | |
| • සාම්පල ලබා ගැනීම සහ විශ්ලේෂණය කිරීම | √ | | |
| 47. පුහුණු කිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | | |
| • ධීවර කාර්මිකයන්/ ජලජීවී වගාකරුවන්/ පිරිසැකසුම් | | | √ |
| • ආයතන නිලධාරීන්/ තත්ත්ව පාලන නිලධාරීන් /අදාළ ක්ෂේත්‍ර නිලධාරීන් | √ | | |
| 48. විමර්ශන | | | |
| • රෙගුලාසියට අනුකූල නොවන අවස්ථා සඳහා විමර්ශන සහ පියවර ගැනීම් | √ | | |
| • ආනයනික රටවල් සිදු කරන දැනුම් දීම් සඳහා විමර්ශන සහ පියවර ගැනීම් | √ | | |
| 49. ධීවර යාත්‍රා ලියාපදිංචිය | √ | | |
| 50. මහ මුහුදේ යාත්‍රා මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම | √ | | |
| 51. යාත්‍රා නියමු බලපත්‍ර නිකුත් කිරීම | √ | | |
| 52. විසිතුරු මසුන් ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම | √ | | |
| 53. විසිතුරු මසුන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම | √ | | |
| 54. විසිතුරු මසුන් ප්‍රතිඅපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම | √ | | |
| 55. කටු පොකිරිස්සන් අපනයනය සඳහා බලපත්‍ර ලබාදීම | √ | | |
| 56. කටු පොකිරිස්සන් ළඟතබා ගැනීම, ප්‍රවාහනය | √ | | |
| 57. හක්බෙල්ලන් හා මුහුදු කූඩැල්ලන් ඇල්ලීම සඳහා බලපත්‍ර ලබාදීම | √ | | |
| 58. හක්බෙල්ලන් ළඟ තබා ගැනීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය සඳහා අවසරපත්‍ර ලබා දීම | √ | | |
| 59. හක්බෙල්ලන් අපනයනය සඳහා බලපත්‍ර ලබා දීම | √ | | |
| 60. මුහුදු කූඩැල්ලන් ඇල්ලීම, එකතු කිරීම, ළඟ තබා ගැනීම හා ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීම | √ | | |
| 61. මුහුදු කූඩැල්ලන් ආනයනය, අපනයනය, ප්‍රති අපනයනය සඳහා බලපත්‍ර ලබාදීම | √ | | |
| 62. සිප්පි කටු එකතු කිරීම, ප්‍රවාහනය සහ විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම | √ | | |
| 63. කෘතිම උපස්තර මත වගා කරන ලද කොරල් අපනයනය සඳහා බලපත්‍ර ලබා දීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම | | | √ |

| | | | |
|---|---|---|---|
| 64. මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ආයතන ආනයනය සඳහා ලියාපදිංචි කිරීම | √ | | |
| 65. මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ආයතන ප්‍රතිඅපනයනය සඳහා ලියාපදිංචි කිරීම | | | √ |
| 66. නව යාත්‍රා සඳහා ලියාපදිංචි අංක වෙන්කිරිම, අනුමත කිරිම සහ නිකුත් කිරිම | √ | | |
| 67. නක්ලා (Operculum of ***Chicoreus ramosus***) අපනයනය කිරීම සඳහා බලපත්‍රය | | | √ |
| 68. නක්ලා (Operculum of ***Chicoreus ramosu***s) සන්තකයේ තබාගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | | √ | |
| 69. *Chicoreus ramosus* මාංශ සන්තකයේ තබා ගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | √ | | |
| 70. *Chicoreus ramosus* මාංශ අපනයන බලපත්‍රය | √ | | |
| 71. අජීවී මුහුදු බෙල්ලන්ගේ කවච ප්‍රවාහනය කිරීම, සන්තකයේ තබා ගැනීම සහ ප්‍රදර්ශනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | √ | | |
| 72. මුහුදු තෘණ, ප්‍රවාහනය කිරීම සහ අපනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම | √ | | |
| 73. ලොග් පොත් නිකුත් කිරීම | √ | | |
| 74. විගණන වැඩසටහන් ප්‍රමාණය | √ | | |
| 75. පවරා ඇති සහ අවසන් කර ඇති විගණන වාර්තා ගණන | √ | | |
| 76. කාර්තුවකට වරක් පවත්වනු ලබන විගණන කළමනාකරණ රැස්වීම් ප්‍රමාණය | √ | | |

# 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 2- සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම<br>3- නීරෝගී ජීවිත සහතික කර සෑම වයසක ම සිටින සියල්ලන්ගේ ම සුබ සාධනය ප්‍රවර්ධනය කිරීම<br>8-සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ, තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම<br>12-තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.<br>14- තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය | දේශීය වෙළඳපලෙහි හා අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන්ගේ සෞඛ්‍යාරක්ෂිතභාවය, ගුණාත්මකභාවය හා නීත්‍යානුකූලභාවය තහවුරු කිරීම | | | | √ |
| තිරසර සංවර්ධන ඉලක්ක (01, 02, 12 සහ 14) අරමුණු කර ගනිමින් කාර්යක්ෂම සහ පරිසර හිතකාමී නව තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතයෙන් ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම, විධිමත් කිරීම මගින් මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම හා ධීවර ප්‍රජාවගේ සමාජීය හා ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට | ස්වාභාවික අනතුරු සඳහා වන්දි ලබා දීම | % | | √ | |
| | වෙරළාසන්න මුහුදු තීරයේ මත්ස්‍ය ගහනය වැඩි කිරීම සඳහා අබලි වාහන භාවිතයෙන් ඇටවුම් යෙදවීම | % | | √ | |
| | ධීවර අංශය පිළිබඳ දැනුවත් කිරීමේ ඒකාබද්ධ වැඩසටහන | % | | | √ |
| | කලපු සීමා නිර්ණය කිරීම | % | √ | | |
| | සුළුපන්න (OFRP / NTRB) ධීවර රැකියා සුරක්ෂිත කිරීම හා ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට අදාළව ධීවර කර්මාන්තය සඳහා ඉන්ධන සහනාධාර ලබා දීම | % | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | NTRB යාත්‍රා හිමියන් වෙත ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) මගින් මාසික ජීවනාධාරයක් ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම | % | | | √ |
| | මැයි මස 21වන දින සිදු වූ New X Press Pearl භාණ්ඩ නෞකාව ගිනි ගැනීමේ සිද්ධිය හේතුවෙන් ධීවර ක්ෂේත්‍රයට සිදු වූ බලපෑම නියාමනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ ප්‍රගතිය | % | | √ | |

**<u>5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.</u>**

තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ධීවර පවුල්වල සමාජීය, ආර්ථික සුරක්ෂිතතාවය තහවුරු කිරීම අරමුණු කර ගනිමින් ධීවරයින් සඳහා රක්ෂණ යෝජනා ක්‍රියාත්මක කරන ලදී.

තවත් එක් විශේෂ ව්‍යාපෘතියක් ලෙස වෙරළාසන්න මුහුදේ මත්ස්‍ය ගහනය වැඩි කිරීමේ අරමුණින් භාවිතයෙන් ඉවත් කළ බස්රථ යොදා ගනිමින් වෙරළාසන්න මුහුදේ කෘතිම මත්ස්‍ය වාසස්ථාන ඇති කිරීමේ ව්‍යාපෘතිය යාපනය දිස්ත්‍රික්කයේ දෙවන අදියරය ලෙස කන්කසන්තුර ප්‍රදේශයේ ක්‍රියාත්මක කළ අතර, 2023 වර්ෂයේ පළමු කාර්තුවේ දී ගර්භිත බස්රථ 47ක් ගිල්වීම සිදු කරන ලදී. මෙමගින්, මත්ස්‍ය ගහණය වැඩි කර ගැනීම අපේක්ෂා කරන අතර, ධීවර ප්‍රජාවගේ ආර්ථික සුරක්ෂිතතාවය ඇති කරයි.

ධීවර රැකියා සුරක්ෂිත කිරීම හා ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට අදාළව ධීවර කර්මාන්තය සඳහා ඍජු ඉන්ධන අවශ්‍යතාවය වෙනුවෙන් ධීවර දිස්ත්‍රික්ක 15හි තෝරා ගන්නා ලද පිරවුම් හල් තුළින් භූමිතෙල් ලීටර 4,276,992ක් 2023 වර්ෂය තුළ දී ධීවරයින් වෙත ලබා දීම සිදුකරන ලදී.

තවද, අඩු අදායම්ලාභී ධීවර කාර්මිකයින් වෙත සහන සැලසීමේ අරමුණින් ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) වෙත ඉදිරිපත් කළ ව්‍යාපෘති අතරින් එක් යෝජනාවක් වන යාන්ත්‍රික නොවන සාම්ප්‍රදායික යාත්‍රා හිමියන් (NTRB) වෙත ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් ජීවනාධාරයක් ලබා දීමේ වැඩසටහන යටතේ ප්‍රධාන අදියර 02ක් යටතේ මුළු ප්‍රතිලාභීන් 11,794ක් සඳහා ජීවනාධාරය ලබා දෙන ලදී.

ධීවර කර්මාන්තයේ නියැලෙන ධීවර ප්‍රජාවගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ධීවර හැඳුනුම්පත් සහ යාත්‍රා නියමු බලපත්‍ර නිකුත් කිරීම සිදු කළ අතර ධීවර හැඳුනුම්පත් 2,603ක් හා යාත්‍රා නියමු බලපත්‍ර 1,485ක් 2023 වර්ෂයේදී නිකුත් කරන ලදී.

**ජයග්‍රහණ**

- පරිපාලන දඩ පැනවීම සඳහා සියලු දිස්ත්‍රික් කාර්යාලවලින් යොමු වන ඉල්ලීම්, අදාළ ක්‍රියාවලියට අනුව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පරිපාලන දඩ පැනවීමේ ක්‍රමවේදයන් 37න් 29ක් සම්පූර්ණ කිරීම
- යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මගින් හඳුනා ගන්නා ලද නීති කඩ කිරීම සඳහා වන විමර්ශන කටයුතු 529ක් සිදු කිරීම
- මාර්ගගත හා භෞතික පුහුණු අවස්ථා මගින් සමස්ථ නිළධාරීන් සඳහා පුහුණු අවස්ථා ලබා දිය හැකි වීම

- **අභියෝග**
  - රටේ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් නිකුත් කරන ලද රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය අනුව වෙන් වූ ප්‍රතිපාදන අවම වීම මත ඉලක්ක ගත කාර්යයන් සපුරා ගත නොහැකි වීම
  - නිළධාරීන් විදෙස් ගත වීම හේතුවෙන් අත්‍යවශ්‍ය කාර්යයමණ්ඩල හිඟකම සහ සම්පත් දායකයන් සපයා ගැනීමේ ගැටළුව
  - දිස්ත්‍රික් මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා යොමු වීමේ දී ප්‍රවාහනය සඳහා වන ඉන්ධන වියදම් අධික වීම හේතුවෙන් ප්‍රමාණවත් පරිදි දිස්ත්‍රික්ක මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණයක් පැවැත්වීමට නොහැකි වීම

# 06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යාව කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/ (අතිරික්ත ) ** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 51 | 32 | 19 |
| තෘතීයික | 28 | 18 | 10 |
| ද්විතීයික | 928 | 705 | 223 |
| ප්‍රාථමික | 105 | 100 | 05 |

## 6. 2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ සේවක අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු පවතින තනතුරු සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. ඒ අනුව, ඉදිරියේ දී බඳවා ගැනීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

අභ්‍යන්තර පුහුණු වැඩසටහන් - දේශීය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද නිලධාරී සංඛ්‍යාව | වැඩසටහනක කාල සීමාව හා වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ නිලධාරීන් | සමස්ථ ආයෝජනය (රු.) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|
| ධීවර බෝට්ටු යොදා ගනිමින් සිදු කරනු ලබන නීති විරෝධී කටයුතු මර්ධනය කිරීම සඳහා ධීවර නීතිය පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමේ වැඩසටහන් (මූල්‍ය ප්‍රතිපාදන වැය වූ) | 106 | දින 03 වැඩසටහන් 02 | පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශය/ නාවික හමුදා නිලධාරීන් | 58,394.00 | අදාළ විෂය පථය පිළිබඳ දැනුම නිලධාරීන්ට ලබා දෙන ලදී. |
| ධීවර බෝට්ටු යොදා ගනිමින් සිදු කරනු ලබන නීතිවිරෝධී කටයුතු මර්ධනය කිරීම සඳහා ධීවර නීතිය පිළිබඳව අදාළ | 126 | දින 05 වැඩසටහන් 05 | නාවික හමුදා නිලධාරීන්/ වෙරළ ආරක්ෂක නිලධාරීන් | - | අදාළ විෂය පථය පිළිබඳ දැනුම නිලධාරීන්ට ලබා දෙන ලදී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| පාර්ශ්වයන් දැනුවත් කිරීමේ වැඩසටහන් (දේශන සඳහා සම්පත්දායකයන් ලෙස සහභාගී වීම) | | | | | |
| දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්, ධාරිතා සංවර්ධන වැඩසටහන් සහ පශ්චාත් උපාධි/ ඩිප්ලෝමා වැඩසටහන් සංවිධානය කිරීම (මූල්‍ය ප්‍රතිපාදන වැය වූ) | 341 | දින - 1/2/3/4/25<br>මාස 6<br>අවුරුදු 2<br>වැඩසටහන් 19 | විධායක නිලධාරි/ මාණ්ඩලික / ධීවර නිලධාරි/ තත්ත්ව පාලන නිලධාරීන් /සංවර්ධන නිලධාරි/ කළමනාකරණ සේවා නිලධාරි/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරි/ කාර්යාල කාර්ය සහායක සහ රියදුරු | 1,806,159.00 | අදාළ විෂය පථය පිළිබඳ දැනුම නිලධාරීන්ට ලබා දෙන ලදී. |
| දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම (මාර්ගගත ක්‍රමයට සහ මාර්ගගත නොවන ක්‍රමයට) (මූල්‍ය ප්‍රතිපාදන වැය නොවූ) | 409 | දින 1,2 සහ 2ට වැඩි වැඩසටහන් 44 | විධායක නිලධාරි/ මාණ්ඩලික නිලධාරි/ ධීවර නිලධාරි/ සංවර්ධන නිලධාරි/ නීති නිලධාරි/ධීවර පරීක්ෂක නිලධාරි/ තොරතුරු තාක්ෂණ නිලධාරි/තත්ත්ව පාලන නිලධාරි/ | - | අදාළ විෂය පථය සම්බන්ධව දැනුම නිලධාරීන්ට ලබා දෙන ලදී. |
| කාර්යක්ෂමතා කඩයිම් විභාග පැවැත්වීම | 08 | වැඩසටහන් 02 | විධායක සේවා ශ්‍රේණියේ II/ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා | 225,033.43 | අදාළ විෂය පථය පිළිබඳ දැනුම නිලධාරීන්ට ලබා දෙන ලදී. |
| ප්‍රධාන වරායන් ආශ්‍රිතව යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මත්ද්‍රව්‍ය සහ බෝ නොවන රෝග නිවාරණය සම්බන්ධව දැනුවත් කිරීමේ | 348 | දින 07 වැඩසටහන් 07 | ධීවර යාත්‍රාවල හිමිකරුවන් ධීවර යාත්‍රා නියමුවන් සහ ගැනියන් | 277,310.00 | අදාළ විෂය පථය පිළිබඳ දැනුම නිලධාරීන්ට ලබා දෙන ලදී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| වැඩසටහන<br>• කළුතර - බේරුවල<br>• මීගමුව - පිටිපන<br>• හලාවත - වැල්ලමංකර<br>• ගාල්ල<br>• දික්ඕවිට<br>• අම්බලන්ගොඩ<br>• හික්කඩුව | | | | | |
| මනා ලෙස මසුන් හැසිරවීමේ භාවිතයන් පිළිබඳ බෝට්ටු අයිතිකරුවන් සහ ධීවරයින් දැනුවත් කිරීම<br>• මහවැව<br>• මාතර<br>• මඩකලපුව<br>• මඩකලපුව-වාලච්චේන වරාය<br>• යාපනය-කරෙයිනගර්<br>• ත්‍රිකුණාමලය-"Sandy Bay Society"<br>• ත්‍රිකුණාමලය-"Karamalayu Society Building"<br>• මුලතිව්<br>• කල්මුණේ | 540 | දින 09 වැඩසටහන් 09 | ධීවර යාත්‍රාවල හිමිකරුවන් හා ධීවරයින් | 150,960.00 | අදාළ විෂය පථය පිළිබඳ දැනුම නිලධාරීන්ට ලබා දෙන ලදී |
| මහනුවර තලතුඔය නාවික හමුදා කඳවුරෙහි නිලධාරීන් දැනුවත් කිරීම | 43 | දින 01 වැඩසටහන් 01 | නාවික හමුදා නිලධාරින් | 33,255.50 | - |
| නව ධීවර පනත පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන | 86 | දින 02 වැඩසටහන් 01 | - | 451,374.00 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තියට (ILO) අනුව සී.188 පිළිබඳ දිස්ත්‍රික් ධීවරයන් දැනුවත් කිරීම<br>• තංගල්ල<br>• කළුතර<br>• ගාල්ල<br>• මාතර<br>• යාපනය<br>• ත්‍රිකුණාමලය<br>• මීගමුව<br>• මඩකලපුව<br>• ටාජ් සමුද්‍ර හෝටලය<br>• ලෝක ධීවර දින වැඩසටහන | 400 | දින 10 වැඩසටහන් 10 | ධීවරයින් | - | අදාළ විෂය පථය පිළිබඳ දැනුම නිලධාරීන්ට ලබා දෙන ලදී. |

**2023 වර්ෂය තුළ දී පුහුණු සහ දැනුවත් කිරීම් වැඩසටහන් සහ වියදම් වූ මූල්‍ය ප්‍රතිපාදන**

| වැය ශීර්ෂය | පැවැත් වූ මුළු වැඩසටහන් සංඛ්‍යාව | වියදම් වූ මුළු මුදල (රු.) |
|---|---|---|
| 290-01-1-0-2401 | 23 | 2,089,586.43 |
| 290-1-01-2202 | 18 | 912,899.50 |

### 6.3.1. ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන්වල දායකත්වය

- රාජ්‍ය නිලධාරීන්ගේ රාජකාරී සේවාවන්ට අදාළව ඔවුන්ගේ දැනුම ආකල්ප සංවර්ධනය උදෙසා ආයතනය මගින් ලබා දෙන ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා ඔවුන් යොමු කරවීම ඉතාමත් වැදගත් වේ.

- මේ යටතේ, පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කරවීම පිළිබඳව විශේෂ අවධානය යොමු කර ඇත.

- එම වැඩසටහන් දෙපාර්තමේන්තුව තුළ හා වෙනත් බාහිර ආයතන වෙත නිලධාරීන් සහභාගී කරවීමෙන් සිදු කරනු ලැබේ.

- මෙම වැඩසටහන් මගින් නිලධාරීන්ට රාජකාරී ආයතනයන්හී පැවරෙන රාජකාරී ලැයිස්තුවට අනුව නිර්මාණාත්මකව සහ ප්‍රායෝගිකව එම රාජකාරී සේවාවන් සාර්ථකව සිදු කිරීමටත් හැකියාව ලැබේ. එමෙන්ම, අනෙකුත් ආයතන සමඟ සම්බන්ධතාවයන් වැඩිදියුණු කිරීමටත් මෙම වැඩසටහන් මගින් අවස්ථාව ලැබේ.

- ඒ අනුව, නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනයටත් ආයතනයේ දියුණුවට නිලධාරීන්ගේ සක්‍රිය සහභාගීත්වය සහ සහයෝගය ලබා ගැනීමටත් දැනුම ආකල්පවලින් පරිපූර්ණ නිලධාරීන් පිරිසක් රාජ්‍ය සේවය සඳහා බිහි කිරීමටත් මෙම වැඩසටහන් හේතු වේ.

## 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ./ අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | √ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | √ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම) | X | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | X | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | √ | | |
| 1.6 | වෙනත් | √ | | |
| **2.** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | √ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | √ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | √ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | √ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | √ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | √ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | √ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | √ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | √ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | √ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | √ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම ( මු. රෙ. 135 )** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | √ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | √ | | |
| 3.3 | සෑම ගණුදෙනුවක් ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | √ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2014 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | √ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | √ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | √ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණක සැලැස්ම සකස් කිරීම | √ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තු සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | √ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | √ | | |
| **5** | **විගණන විමසුම** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | √ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු. රෙ. 134(2) DMA/ 1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ජා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | √ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකට ම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | √ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ (4094) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වග පිටපත් කළමනාකරණය විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | √ | | |
| 6.4 | මුදල් රෙගුලාසි (3) 134 ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | √ | | |
| **0.7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1 - 2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම | √ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ජේදය අනුව, වත්කම් මිළ දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | √ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ජේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | √ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2016/05 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | √ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | √ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු. රෙ. 772 අනුව සිදු කිරීම | √ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | √ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | X | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | √ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු. රෙ. 103, 104 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | √ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | √ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | X | | 2023 වර්ෂයට අදාළව එවැනි වාහන නැත. |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | √ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | √ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් ආවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | √ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | √ | | |
| 11.2 | මු. රෙ (1) 94 ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | √ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | √ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | √ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | √ | | |

| | | | | |
|---|---|---|---|---|
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | √ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | √ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | √ | | |
| 14.2 | මු. රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | √ | | |
| 14.3 | මු. රෙ. 371 ප්‍රකාර අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | √ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | √ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | √ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුව ම ආදායම් බැර කර තිබීම | √ | | |
| 15.3 | මු. රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | √ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වා ගෙන යාම | √ | | |
| 16.2 | කාර්යය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | √ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | √ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | √ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | √ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම | X | | අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය වී වාර්ෂික වාර්තා සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | √ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | √ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | X | | සකස් කරමින් පවතී. |
| 19.2 | කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | X | | සකස් කරමින් පවතී. |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම අත්සන් කර තිබීම | √ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 06 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන | X | | 2024 වර්ෂයේ දී |

| | | | | |
|---|---|---|---|---|
| | සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | | | සැලැස්ම සකස් කර නිලධාරියෙකු පත් කරනු ලැබේ. |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | √ | | |

මගේ අංකය / எனது இல. / My No. FLS/B/DFAR/2/23/01 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024 මැයි 28 දින

අධ්‍යක්ෂ ජනරාල්

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේනතුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමතයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 2.2 (ඇ) | වාර්ෂික බලපත්‍ර ගාස්තු ආදායමේ නිරවද්‍යතාවය පරීක්ෂාව. | 2.1 |
| 3.1.2 | ජලය කාන්දු වීමක් නිසා සිදු වූ හානිය දෙපාර්තමේන්තුවේ හානි හා පාඩු ලේඛනයෙහි ඇතුළත් කර නොතිබීම. | 3.3 |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි (ACAF ආකෘතිය), ආදායම් නොවන ලැබීම් යටතේ භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් හා භාණ්ඩාගාරයට කරන ප්‍රේෂණ වටිනාකම් වෙන් වෙන්ව දැක්විය යුතු වුවත්, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ 2023 වර්ෂයේ මුළු භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් වු රු.477,521,000 ක වටිනාකමින් භාණ්ඩාගාරයට ප්‍රේෂණ රු.76,883,701 ක වටිනාකම අඩුකර රු.400,637,299 වු ශුද්ධ භාණ්ඩාගාර අග්‍රිම ලැබීම්, ආදායම් නොවන ලැබීම් යටතේ භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිමය ලෙස දක්වා තිබුණි.

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2023 නොවැම්බර් 11 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ ඡේද අංක 7.7 ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදල් හා හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන සෘජු ක්‍රමය යටතේ පිළියෙල කළ යුතු වුවත්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මුදල් පදනම මත සකස් කර තිබුණ

### 1.6.3 අත්තිකාරම් ගෙවීම්

(අ) 2022 දෙසැම්බර් 30 දින පෞද්ගලික හේතුවක් මත දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා අස් වී තිබුණු වැටුප් අංක 5668 දරන සංවර්ධන නිලධාරියාගෙන් අයවීමට තිබු රු.139,800 ක අපදා ණය ශේෂය අයකර ගැනීමකින් තොරව දෙපාර්තමේන්තුවේ සේවා නියුක්ත අඛණ්ඩව ණය අයවෙමින් පවතින නිලධාරීන්ගේ ණය ශේෂ ඇතුළත් ලේඛනය තුළ දක්වා තිබුණි.

(ආ) 2023 අගෝස්තු 22 දින සිට සේවය අතහැර ගොස් සිටි වැටුප් අංක 12036 දරන සංවර්ධන නිලධාරියාගෙන් අයවිය යුතු ආපදා ණය ශේෂය රු.131,899 ක්වු අතර එම ණය ශේෂය දෙපාර්තමේන්තුවේ සේවා නියුක්ත අඛණ්ඩව ණය අයවෙමින් පවතින නිලධාරීන්ගේ ණය ශේෂ ඇතුළත් ලේඛනය තුළ දක්වා තිබුණි.

### 1.6.4 මූල්‍ය නොවන වත්කම්

අංක 05/2023 හා 2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව ACA 6 ආකෘතිය වෙනුවට CIGAS වෙබ් යෙදුම මගින් ජනනය කරන ලද මූල්‍ය නොවන වත්කම් වාර්තාව (SA 82) අමුණා තිබිය යුතු වුවත් දෙපාර්තමේන්තුව එපරිදි කටයුතු කර නොතිබුණි.

### 1.6.5 තැන්පතු ගිණුම් ශේෂ

(අ) අංක 6000-0-0-16-0-47 දරන කොන්ත්‍රාත් රැඳවුම් තැන්පතු ගිණුමේ කාල විශ්ලේෂණය අනුව වර්ෂ 2 ත් 5 ත් අතර රු.3,043,559 ක තැන්පතු සහ වර්ෂ 5 ට වැඩි තැන්පතු කිසිවක් නොමැති බව සඳහන් කර තිබුණ ද, වර්ෂ 2 ත් 5 ත් අතර කල්ගත වූ තැන්පතු ලෙස දක්වා ඇති ශේෂවලින් රු.346,063 ක තැන්පතු වර්ෂ 5 ට වැඩි කාලයක සිට තැන්පතු ලේජරයේ පවතින අතර එම තැන්පතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අංක 6000-0-0-13-0-64 දරන තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු ගිණුමේ කාල විශ්ලේෂණය අනුව වර්ෂ 2 ත් 5 ත් අතර රු.17,176,464 ක තැන්පතු හා වර්ෂ 5 ට වැඩි තැන්පතු කිසිවක් නොමැති බව දක්වා තිබුණ ද, එම වර්ෂ 2 ත් 5 ත් අතර කල්ගත වූ තැන්පතු ලෙස දක්වා තිබූ ශේෂවලින් රු.8,026,493 ක තැන්පතු වර්ෂ 5 කට වැඩි කාලයක සිට තැන්පතු ලෙජරයේ පවතින තැන්පතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තැන්පතු ගිණුමට සටහන් කිරීමේ දී විස්තරය පැහැදිලිව සටහන් කිරීම වෙනුවට පෞද්ගලික නමින් හෝ දිස්ත්‍රික් ධීවර කාර්යාලවල නමින් මුදල් තැන්පත් කර තිබූ බව සඳහන් කිරීම නිසා මුදල් තැන්පත් කිරීමට අදාළ කාරණය නිශ්චිතව හඳුනාගැනීමට නොහැකි විය.

(ඇ) 2023 දෙසැම්බර් 31 දිනට එකතුව වූ රු.231,263,449 ක්වූ තැන්පතු ශේෂ සඳහා තැන්පතු වර්ෂය අනුව කේවල ශේෂ ලැයිස්තුවක් දෙපාර්තමේන්තුව විසින් සකස් කර නොතිබුණි

### 1.6.6 අග්‍රිම ශේෂය

(අ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (SA 70 වාර්තාව) අනුව 2023 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.17,042,894 ක් වුවද, 2023 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනයේ (ACA-3 ආකෘතිය) 2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර ශේෂය, 2023 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය හා 2023 දෙසැම්බර් 31 දිනට ආයතන පොත් අනුව ශේෂයන් සඳහා කිසිදු අගයක් දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණ කර තිබූ මුළු මුදල රු.77,000,701 ක් වුවද, ACA-3 ආකෘතිය අනුව පියවිය යුතුව තිබූ මුදල රු.76,883,701 ක් වුයෙන් එම ශේෂයන් අතර රු.117,000 ක වෙනසක් විය.

### 1.6.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

දියවර දිරිය ණය යෝජනා ක්‍රමය ලංකා බැංකුව වෙත දිගු කාලීනව භාණ්ඩාගාරය විසින් මාසික පොලී සහනාධාර ගෙවීමක් සිදුකළ යුතුව තිබෙන ණය යෝජනා ක්‍රමයක් බවත්, රජය වෙනුවෙන් පොලී සහනාධාරය ගෙවීම සහ නියාමනය කිරීම සඳහා බලය පවරා තිබූ රාජ්‍ය ආයතනය වන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත වගකීම පැවරී තිබුණ ද, මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම ලබාගෙන තිබූ එක් එක් ධීවරයා ණය ලබාගත් දිනය, ණය වාරික ගෙවා අවසන් වන දිනය, මාසිකව ගෙවිය යුතු පොලී සහනාධාර ආදී ගෙවීම් විස්තර වෙන වෙනම හඳුනාගැනීමට හැකිවන පරිදි ලේඛන හෝ දත්ත ගොනුවක් පවත්වා ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් යොදා නොතිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබූ රු.11,996,398 ක මුදල ද ඇතුළුව වසර 12 ක වැඩි කාලයක් තුළ ලංකා බැංකුවට ගෙවා තිබෙන රු.මිලියන 300 කට වැඩි පොලී සහනාධාරයේ නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට නොහැකි වූ අතර මේ දක්වා ගෙවා තිබෙන පොලී සහනාධාර මුදල නිවැරදිව ගණනය කිරීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම දෙපාර්තමේන්තු විසින් ණය හිමියන්ගෙන් ණය වාරික අයවීම, නොපියවා තිබෙන ශේෂ සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් ලේඛන හෝ දත්ත පද්ධතියක් පවත්වාගෙන නොයාම නිසා මෙම ණය යෝජනා ක්‍රමයේ පොලී සහනාධාරය ගෙවීමට ඉතිරිව තිබෙන ණය මුදල, ගෙවීමට තිබෙන පොලීය, සහ ගෙවා අවසන් කළ ණයකරුවන් කවුරුන් ද යන්න හඳුනාගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ බැවින් මෙම ගණුදෙනුවේ නිරවද්‍යතාවය තහවුරු නොවීය. කෙසේ වෙතත් බැංකු ලේඛන අනුව 2023 දෙසැම්බර් 31 දිනවන විට ලබා දී තිබූ ණය ශේෂය රු.776,515,188 ක් විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

2021 නොවැම්බර් 24 දිනැති අංක 2255/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් බලපත්‍ර ගාස්තු අයකිරීමේ නියෝග ප්‍රකාරව ප්‍රධාන ක්‍රියාකාරකම් 05 යටතේ බලපත්‍ර ලබාදිය හැකි අවස්ථා 53 ක් සඳහා රාජ්‍ය ආදායම් එකතුකිරීම සඳහා ගාස්තු පැනවීමට අදාල නියෝග අමාත්‍යාවරයා විසින් නිකුත් කර තිබුණි. කෙසේ වෙතත් බලපත්‍ර ලබාදීම දෙපාර්තමේන්තු ලිපි ශීර්ෂ සහිත A4 කඩදාසියක බලපත්‍ර නිකුත් කිරීම නිසා රජයට ආදායමක් නොමැතිව බලපත්‍රයක් නිකුත්වීමට අවස්ථාවක් තිබෙන අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එකතුකර තිබූ රු.179,170,315 ක වාර්ෂික බලපත්‍ර ගාස්තු ආදායම නිකුත් කර තිබූ සියලුම බලපත්‍රවලට අදාල

ආදායම බව සැසඳීමට නොහැකිවීම නිසා ඉහත සඳහන් වාර්ෂික බලපත්‍ර ගාස්තු ආදායමේ නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේ දී සෑහීමකට පත්විය නොහැකි විය.

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

(අ) මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) හි 6 වන තීරුවේ බැරකම් ශේෂය රු.3,136,603 ක්වූ අතර 5 වන තීරුවෙහි ගෙවන ලද බැරකම් කිසිවක් නොමැති බැවින් 4 තීරුවෙහි සංශෝධිත බැරකම් ශේෂය ද රු.3,136,603 ක් විය යුතු වුවද ඇමුණුම (iii) හි 4 වන තීරුවල බැරකම් ශේෂය රු.2,662,840 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.473,763 ක වෙනසක් විය.

(ආ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) ආකෘතියේ බැරකම් ශේෂය රු.3,136,603 ක් වන අතර, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (SA 92 වාර්තාව) අනුව භාණ්ඩාගාරය විසින් අනුමත කර ඇති ශේෂය රු.2,393,283 ක් වුයෙන් රු.743,220 ක වෙනසක් විය.

(ඇ) මුදල් රෙගුලාසි 94(i) ප්‍රකාරව වෙනත් ආකාරයන්ට විධිවිධාන සලසා ඇති අවස්ථාවල දී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු අතර, දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිවිටෙක මුදල් වර්ෂය සඳහා සලසන ලද ප්‍රතිපාදන මුදල් නොඉක්මවිය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් 290-1-1-0-1101 සහ 290-1-1-0-1102 දරන වැය විෂයයන් යටතේ ලබා දී තිබු ප්‍රතිපාදනයන්හි ඉතිරිය ඉක්මවා පිළිවෙලින් රු.193,724 ක් සහ රු.16,039 ක බැරකම්වලට එළඹී තිබුණි.

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| මුදල් රෙගුලාසි 128(2) ඇ | ගණන්දීමේ නිලධාරි විසින් තම වගකීමට බැදී සිටින ආදායම් ශීර්ෂ උපශීර්ෂ විෂයයන් හා උප විෂයයන් යටතේ එක් එක් මුදල් වර්ෂයේ ජුනි 30 දිනට හා දෙසැම්බර් 31 දිනට හිඟ රාජ්‍ය ආදායම් පිළිබඳ තත්ත්වය පෙන්නුම් කරන අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කර භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අංක 1003.07.06 |

දරන ආදායම් ශීර්ෂය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් පිළිබඳ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 316 | බලපත්‍ර පොත්, කුවිතාන්සි පොත් වැනි උප පත්‍රිකා පොත් හා මූල්‍ය වටිනාකමක් ඇති වෙනත් පෝරම නිදහස් වන තෙක් තැන්පත් කොට තැබීම සඳහා විශේෂයෙන් සම්පාදනය කොට ඇති සුරක්ෂිතාගාරයක, සේප්පුවක, ආරක්ෂක පෙට්ටියක, ආරක්ෂාක කාමරයක හෝ වෙනත් ආරක්ෂිත ස්ථානයක සැමවිටම සුරක්ෂිතව තැබිය යුතු වුවත් මීගමුව දිස්ත්‍රික් ධීවර කාර්යාලය විසින් භාවිතා නොකළ අලුත් කුවිතාන්සි පොත් අගුලු දැමිය නොහැකි වානේ කබඩ් එකක් තුළ ගොඩගසා තිබුණි. |
| මුදල් රෙගුලාසි 756(6) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ දී භා.භා.ග.ප 66 හි පවතින ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මෙම චක්‍රලේඛයේ මාර්ගෝපදේශ 03 ආකෘති පත්‍ර 03 හි දැක්වෙන පරිදි වර්ෂ 02 කට වැඩි තැන්පතු පැවැත්මට හේතු වූ කරුණු සහ ඊට අදාළ වටිනාකම් වෙන් වෙන්ව සඳහන් කර නොතිබුණි. |

### 2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

2023 දෙසැම්බර් 31 දිනට හඳුනානොගත් ලැබීම්වල වටිනාකම රු.1,344,682 ක්වූ අතර ඉන් රු.523,606 ක් ලැබීම් 13 ක් මාස 02 සිට 06 දක්වා හඳුනානොගත් ලැබීම්වලින් සමන්විත වූ අතර 2024 මාර්තු 31 දින වනවිට මාස 02 සිට 06 දක්වා වූ රු.195,500 ක ලැබීම් 07 ක් තවදුරටත් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

කාර්යසාධන දර්ශක ලෙස ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් දෛනිකව සිදුකරනු ලබන කාර්යභාරයන් 76 ක් දක්වා තිබූ අතර, ඒවායේ අපේක්ෂිත හා සත්‍ය නිමැවුම සංඛ්‍යාත්මකව හඳුනාගෙන නොතිබුණි.

### 3.2 වත්කම් කළමනාකරණය

(අ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේ එකක් රු.31,000 ක් බැගින් Canon LBP 228 x වර්ගයේ පරිගණක මුද්‍රණ යන්ත්‍ර 10 ක් මිලටගෙන 2021 දෙසැම්බර් 28 ගබඩාව වෙත ලබා දී තිබුණි. එම මුද්‍රණ යන්ත්‍රවලින් 07 ක් 2022 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ විවිධ අංශ වෙත නිකුත් කර තිබුණු අතර ඉතිරි මුද්‍රණ යන්ත්‍ර 3 න් යන්ත්‍ර 2 ක් භාණ්ඩ මිලදීගෙන වර්ෂයකට වඩා වැඩි කාලයක් එනම් 2023 වර්ෂය පුරාම නිෂ්කාර්යව ගබඩාව තුළ පැවතුණි. එම මුද්‍රණ යන්ත්‍රවල නිෂ්පාදිත වගකීම් සහතික කාලය ගබඩාව තුළදීම අවසන් වී තිබූ අතර දෙපාර්තමේන්තුව විසින් පරිගණක මුද්‍රණ යන්ත්‍ර අත්‍යවශ්‍යව නොපවතින අවස්ථාවක දී මිලටගෙන ගබඩාව තුළ රඳවා තබාගැනීමෙන් රජයට නිෂ්කාර්ය වියදමක් දැරීමට සිදු වී තිබුණි.

(ආ) ධීවර දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය වෙත ALDFG හා PELAGIKOS යන ව්‍යාපෘති වලින් ලද ටැබ් යන්ත්‍ර 161 ක ප්‍රමාණයෙන් මීගමුව දිස්ත්‍රික් කාර්යාලය වෙත ටැබ් යන්ත්‍ර 16 ක් ලබා දී තිබුණි. කාර්යාලීය නිලධාරීන් වෙත මෙම ටැබ් යන්ත්‍ර බෙදා දී තිබූ අතර, එම ටැබ් යන්ත්‍ර පොදු 47 බඩු වට්ටෝරු පොතට නිවැරදිව ඇතුළත් කර නොතිබූ අතර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ දී උක්ත ටැබ් යන්ත්‍ර 16 සමීක්ෂණයට භාජනය වී නොතිබුණු බැවින් මෙම ටැබ් යන්ත්‍රවල පැවැත්ම තහවුරු නොවීය.

### 3.3 පාඩු හා හානි

මූල්‍ය ප්‍රකාශනයන්හි ඇමුණුම(i) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් රු.16,519,961 ක අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ 06 වන මහලේ ජලය කාන්දු වීමක් නිසා සිදු වූ හානිය දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන හානි හා පාඩු ලේඛනයෙහි ඇතුළත් කර නොතිබුණි. මේ අනුව මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබූ අතර අලාභයට වගකිව යුතු පාර්ශව පැහැදිලිව හඳුනාගෙන තිබුණ ද රජයට සිදු වී තිබුණ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ (ඉ) උපවගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලු විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුකළ යුතු වුවත් 2023 වර්ෂය සඳහා නිකුත් කර තිබුණු විගණන විමසුම් 9 කට 2024 මැයි 27 දිනවන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.

**3.5 කළමනාකරණ දුර්වලතා**

(අ) (i) ශ්‍රී ලංකාව හා ඕස්ට්‍රේලියානු රජය සමඟ ඇති කරගෙන තිබූ එකඟතාවයන්ට අනුව ඕස්ට්‍රේලියානු රජය විසින් ශ්‍රී ලංකා බහුදින ධීවර යාත්‍රා ගැඹුරු මුහුදෙහි සිදුකරන ධීවර කටයුතු නියාමනය සහ නිරීක්ෂණය කිරීම සඳහා උපකරණ කට්ටල 4200 ක් ලබාදීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීමට 2021 මැයි 31 දින ඉදිරිපත් කර තිබූ අංක 21/0922/311/014 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2021 ජුනි 10 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි.ඒ අනුව මෙම යාත්‍රා නිරීක්ෂණ පද්ධති සවිකිරීමේ වැඩසටහන් සැලසුම අනුව ශ්‍රී ලංකා රජය විසින් මෙම උපකරණ ශ්‍රී ලංකා බහුදින ධීවර යාත්‍රා වලට සවිකිරීමට යන වියදම දැරිය යුතු වේ. එම වියදම එක් පද්ධතියක් සවිකිරීම සඳහා ඇමරිකානු ඩොලර් 45කි.කෙසේ වුවද ටෙන්ඩර් නියමයන් අනුව යාත්‍රා නිරීක්ෂණ පද්ධති 200 ක් අදාළ සැපයුම්කරු විසින් බහුදින ධීවර යාත්‍රා 200 ක නොමිලේ සවිකළ යුතුය. කෙසේ වෙතත් 2020 දෙසැම්බර් 31 දිනෙන් පසු ලියාපදිංචි කරනු ලබන, නිෂ්පාදනය කරනු ලබන බෝට්ටු සඳහා VMS උපකරණ අදාළ බෝට්ටු හිමිකරුවන් විසින් සවිකර ගත යුතු බවට රජය තීරණය කර තිබුණ ද මේ දිනෙන් පසු ලියාපදිංචි කර තිබූ බෝට්ටු 27ක් සඳහා ද අදාළ යන්ත්‍ර නොමිලේ සවිකර තිබුණේ කෙසේ ද යන්න පිළිබඳව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ii) බහුදින ධීවර කටයුතු සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි බෝට්ටු ලැයිස්තුවේ ලියාපදිංචි දිනය සඳහන් කර නොමැති බෝට්ටු 60 ක් සඳහා VMS යන්ත්‍ර මුදල් අයකිරීමෙන් පසු සවිකර තිබුණි. එමෙන්ම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබීම නිසා මෙම බෝට්ටු 2020 දෙසැම්බර් 31 දිනෙන් පසු ලියාපදිංචි කරනු ලැබූ, නිෂ්පාදනය කරනු ලැබූ බෝට්ටු ද යන්න තහවුරු කර ගැනීමක් සිදුකර නොතිබුණි.

(iii) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි පෞද්ගලික සමාගමක් විසින් මසුන් ඇල්ලීමේ කටයුතු සඳහා ගෙන්වා දික්ඕවිට වරායේ රඳවා තබා තිබුණ විදේශීය රටවලට අයත් ධීවර

යාත්‍රා 18 ක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ බහුදින ධීවර කටයුතු සඳහා ලියාපදිංචි කර තිබූ අතර එම ධීවර යාත්‍රා සඳහා VMS යන්ත්‍ර සවිකර නොතිබූ අතර බහුදින ධීවර කටයුතු සඳහා රඳවා තිබූ එම යාත්‍රා දීර්ඝ කාලයක් තිස්සේ ධීවර කර්මාන්තයේ යෙදී නොතිබුණි. VMS පද්ධති සවිකර නොතිබූ මෙම යාත්‍රා අවස්ථා කීපයකදී වරායෙන් පිටතට ගැඹුරු මුහුදේ යාත්‍රා කර තිබුණ ද මෙම යාත්‍රාවල ගැඹුරු මුහුදේ යාත්‍රා කිරීම් පිළිබඳ තොරතුරු ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. මේ අනුව ධීවර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අනෙකුත් බහුදින ධීවර යාත්‍රා සඳහා අදාළ වන නීතිමය තත්ත්වයෙන් බැහැරව කටයුතු කිරීමට පෞද්ගලික සමාගමකට අයත් බහුදින ධීවර යාත්‍රා සඳහා අවස්ථාව සලසා දීම තුළින් එම බහුදින ධීවර යාත්‍රාවල ධීවර කටයුතු පිළිබඳව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය විගණනයේ දී ගැටලු සහගත විය.

(iv) අංක IMULA-0140-CBO යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබූ විදේශීය බහුදින ධීවර යාත්‍රාව 2022 මැයි 19 දින දික්ඕවිට ධීවර වරායෙන් ධීවර කටයුතු සඳහා පිටත්ව ගොස් ඇති අතර නැවත 2022 ජූලි 04 දින වරායට ආපසු පැමිණ ඇති අතර ඊට අදාළ ලොග් සටහන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබූ අතර ධීවර දෙපාර්තමේන්තුව දික්ඕවිට කාර්යාලයේ බහුදින ධීවර යාත්‍රා නැවත පැමිණීමේ ලේඛනයේ ධීවර මෙහෙයුම් කටයුතු නොමැති (No Operation) ලෙස සටහන් තබා ඇත. මෙසේ දින 46 කට පසු ගැඹුරු මුහුදේ යාත්‍රා කිරීමෙන් ආපසු පැමිණ තිබූ ධීවර යාත්‍රාව සිදුකර තිබූ ධීවර කටයුතු මොනවාද යන්න පිළිබඳව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයක් සිදු වී නොතිබුණි.

(ආ) (i) 2016 දෙසැම්බර් 20 දිනැති අංක අමප/16/2547/725/020-II දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් රජයේ සහනාධාර යටතේ අඩි 55 කින් යුත් නවීන තාක්ෂණය සහිත ධීවර යාත්‍රා 10 ක් ලබාදීම සඳහා රු.මිලියන 130 ක් සහ යාත්‍රා 10 සඳහා සියයට 15 ක වැට් බද්ද ගෙවීම සඳහා රු.මිලියන 39 ක ප්‍රතිපාදන අනුමත වී තිබුණි. මෙම සහනාධාර ක්‍රමවේදය යටතේ, නිෂ්පාදනය ආරම්භ කර තිබූ ධීවර යාත්‍රා 10 න් නෝර්ත් වෙස්ට් මැරීන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයෙන් ධීවර යාත්‍රා 3 ක් නිෂ්පාදනය කරවා ගැනීම සඳහා භාර දී තිබුණ ද, IMUL-A-0061-KMN සහ IMUL-A-0062- KMN යන යාත්‍රා විගණිත දින වන විටත් නිෂ්පාදනය අවසන් කර එහි හිමිකරුවන්ට භාර දීමට කටයුතු කර නොතිබුණි.

(ii) සියයට 50 සහනාධාර ව්‍යාපෘතිය යටතේ ධීවර යාත්‍රා නිෂ්පාදනය කිරීම කොන්ත්‍රාත්තුව භාරදීමේ ලිපියෙහි නිෂ්පාදන කටයුතු නිසි අයුරින් සිදුනොකළහොත් ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව කොන්දේසි ඇතුළත් කර තිබුණ ද, සහනාධාර ක්‍රමය යටතේ ධීවර යාත්‍රා නිෂ්පාදනය වෙනුවෙන් 2016 නොවැම්බර් 16 වන දින අත්සන් කර තිබූ සිව් පාර්ශවීය ගිවිසුමේ ඊට අදාළ ප්‍රතිපාදන ඇතුළත් කර නොතිබීම හේතුවෙන් යාත්‍රා නිෂ්පාදනයේ දී සිදුවී තිබෙන කාල ප්‍රමාදය සම්බන්ධයෙන් ගිවිසුම ප්‍රකාරව කටයුතු කිරීමට හැකියාවක් නොතිබුණි. මේ අනුව රාජ්‍ය මුදල් වියදම් කිරීමේ දී ගණන්දීමේ නිලධාරී විසින් මුදල් රෙගුලාසි 156(7) ප්‍රකාරව සකසුරුවම්භාවය පිළිබඳ අවධානය යොමුකර වියදම් කළ යුතු බව පැහැදිලිව සඳහන්ව තිබුණ ද මෙම යාත්‍රා නිෂ්පාදනය සඳහා ගෙවීම් කිරීමේ දී එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) සහනාධාර ක්‍රමවේදය යටතේ ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් විසින් සියයට 50 ප්‍රතිපාදන සඳහා දායකවිය යුතු වුවත් අංක DFAR/F/4/1 පොදු තැන්පත්/2023 හා 2023 අගෝස්තු 07 දින ධීවර හා ජලජ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීගේ ලිපිය ප්‍රකාරව අංක IMUL-A-0062 KMN දරන යාත්‍රාව සඳහා යාත්‍රාවේ ප්‍රතිලාභී විසින් රු.5,000,000 ක මුදලක් පමණක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ තැන්පත් කර තිබිය දී, දෙපාර්තමේන්තුව විසින් යාත්‍රා නිෂ්පාදන කරු වෙත රු.14,950,000 ක මුදලක් 2016 වර්ෂයේ දී ගෙවීම් කර තිබුණි. මේ අනුව රු.14,950,000 ක මහජන මුදල් වසර 7 කට වැඩි කාලයක් බාහිර ආයතන වෙත රැඳවීමට කටයුතු කර තිබීම මගින් මුදල් රෙගුලාසි 156(7) ට පටහැනිව කටයුතු කර තිබුණි.

(ඇ) IMUL-A-0844 CHW අංක දරන සී-නෝර් පදනම සියයට 50 රජයේ සහනාධාර මත නිෂ්පාදනය කරන ලද ධීවර යාත්‍රාව 2018 මාර්තු 22 දින සිදුකර තිබූ ප්‍රථම මුහුදු ගමනේදීම ගිනිගෙන විනාශ වී තිබුණි. එම යාත්‍රාව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ රක්ෂණය කර තිබූ අතර විනාශයට පත්වූ යාත්‍රාව වෙනුවෙන් රු.29,138,241 වන්දි මුදලක් අනුමත වී තිබුණි. වන්දි මුදල් ගෙවීම සඳහා රක්ෂණ ආයතනයට අදාළ උපදෙස් ලබාදීම සඳහා ධීවර අමාත්‍යාංශයේ ලේකම් විසින් නිලධාරීන් සිව් දෙනෙකුගෙන යුත් කමිටුවක් පත්කර තිබුණු අතර එකී කමිටුව විසින් සහනාධාර ව්‍යාපෘතියේ අරමුණ වූ මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම හා ගොඩබාන මසුන්ගේ ප්‍රමිතිය ඉහළ නැංවීම සාක්ෂාත් කර ගැනීම සඳහා ධීවර යාත්‍රාවක් නැවත නිෂ්පාදනය කිරීමට මෙම වන්දි මුදල යෙදවීම හෝ වන්දි මුදලින් යාත්‍රාව නිෂ්පාදනයට වැය වූ මුදල යාත්‍රා පරිහරණකාරිය වෙත ගෙවීම යෝග්‍ය බව සඳහන් කර තිබුණ ද සම්පූර්ණ වන්දි මුදලම ධීවර යාත්‍රාවේ හිමිකාරීත්වය දරනු ලැබූ එකම ලිපිනයේ පදිංචිව යාත්‍රා දෙකක් ලබාගෙන තිබූ තැනැත්තෙකුට ගෙවන ලෙස ධීවර හා ජලජ සම්පත්

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2018 අගෝස්තු 06 දින රක්ෂණ සංස්ථාව වෙත ලිපියක් මඟින් දන්වා තිබීම මඟින් රජයට අලාභයක් වීමට සහ බාහිර පාර්ශවවලට වාසියක් ලැබීමට අවස්ථාව සලසා තිබුණි. යාත්‍රාවේ වියදමින් සියයට 50 ක්වූ රු.149,500,000 ක් පරිහරණකාරිය දැරිය යුතු වුවත් සම්පූර්ණ මුදල වූ රු.29,138,241 ක් ගෙවීම නිසා යාත්‍රාව නිෂ්පාදනයට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබූ රු.14,950,000 ක මහජන මුදල් රජයට ආපසු අයකරගැනීම පිළිබඳ අවධානයක් යොමුකර නොතිබූ අතර මුදල් රෙගුලාසි 103 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) කලපු සංවර්ධන වැඩසටහන යටතේ කලපු සීමා ලකුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ හලාවත කලපුවේ සීමා මායිම් සලකුණු කිරීම සඳහා අවශ්‍ය සීමා මායිම් කණු සංඛ්‍යාව 1,784 ක් වුවද ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී කණු සංඛ්‍යාව 4060 ක් ලෙස සටහන්වීම නිසා වැඩිපුර සාදා නිමකර තිබුණු රු.3,826,639 ක් වටිනා කණු 2276 ක් පුත්තලම කලපුවේ ස්ථාන 13 ක ගොඩගසා තිබුණි. මුදල් රෙගුලාසි 128(1)(එ) ප්‍රකාර මහජන මුදල් වියදම් කිරීමේ දී අරපිරිමැස්ම සහ කාර්යක්ෂමතාවය, විධිමත් බව සහ අවංකභාවය පිළිබඳව ගණන්දීමේ නිලධාරීන් වගකිව යුතුව තිබෙන බව සඳහන්ව තිබුණ ද, ඒ පිළිබඳව සැලකිලිමත් වී නොතිබුණි. හලාවත කලපුව සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩිපුර මිලදී ගැනීම කර තිබූ රු.3,826,639 ක වටිනාකමක් සහිත කොන්ක්‍රීට් කණු 2276 ක පමණ ප්‍රමාණය පුත්තලම කලපුවේ සීමා ලකුණු කිරීම සඳහා යොදා ගැනීමට පසුව තීරණය කර තිබුණි. කෙසේ වෙතත් 2023 දෙසැම්බර් 31 දිනවන විටත් එම කොන්ක්‍රීට් කණු පුත්තලම කලපුව වෙත ප්‍රවාහනය කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම කොන්ක්‍රීට් කණු පුත්තලම කලපුව දක්වා ප්‍රවාහනය කිරීමේ දී අතිරේක මහජන මුදලක් වැය කිරීමට සිදුවන අතර එම වියදම කොපමණ ද යන්න තහවුරු කරගෙන නොතිබුණි.

(ඉ) ආරුගම්බේ කලපුවේ සීමා ලකුණු කිරීම සඳහා මායිම් කණු 1048 ක් නිෂ්පාදනය කර තිබුණ ද මායිම් කණු 420 ක් කලපුව වටා ස්ථාපිත කර තිබූ අතර ඉන් මායිම් කණු 90 ක් හඳුනානොගත් අයවලුන් විසින් ගලවා ඉවත්කර ඇති බව දන්වා තිබුණි. මායිම් කණු 90 ක් ඉදිකිරීමට හා ස්ථාපිත කිරීමට දළ වශයෙන් රු.222,300 ක මුදලක් රජයට වැය වී තිබූ අතර එම හානි හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තව ද, එම ගලවා ඉවත්කර තිබූ මායිම් කණු සඳහා නැවත කණු ස්ථාපිත කිරීම සහ ඉතිරිව තිබූ මායිම් කණු 628 ක ප්‍රමාණයක් කලපු සීමා සලකුණු කිරීම සඳහා ස්ථාපිත කිරීම 2023 දෙසැම්බර් 31 දිනවන විටත් සිදුකර නොතිබුණි.

## 4. තිරසාර සංවර්ධනය

### 4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන ඉලක්ක/අරමුණු හඳුනාගැනීමේ දී ඒවා නිශ්චිත සහ මැනිය හැකි ආකාරයෙන් හඳුනාගෙන නොතිබුණු අතර ජයග්‍රහණ දර්ශක සංඛ්‍යාත්මකව හඳුනාගෙන නොතිබුණි.

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව ධීවර අමාත්‍යාංශය යටතේ 2023 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලවල තොරතුරු පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු/(අතිරික්ත) සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 51 | 32 | 19 |
| තෘතියික | 28 | 18 | 10 |
| ද්විතීයික | 928 | 705 | 223 |
| ප්‍රාථමික | 105 | 100 | 05 |

(ආ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 10 කට අදාළව පුරප්පාඩු 19 ක් ද, තෘතියික මට්ටමේ තනතුරු 02 කට අදාළව පුරප්පාඩු 10 ක් ද, ද්විතීයික මට්ටමේ තනතුරු 08 කට අදාළව පුරප්පාඩු 223 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 කට අදාළව පුරප්පාඩු 05 ක් ද පැවතුණි. ඒ අනුව ජ්‍යෙෂ්ඨ මට්ටම ඇතුළුව තනතුරු විශාල සංඛ්‍යාවක් පුරප්පාඩුව පැවතීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටුකිරීමේ දී බාධාවක් වී තිබුණි.

නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට